# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,875 — 1969 ඔක්තෝබර් 9 වැනි බ්‍රහස්පතින්ද — 1969.10.9

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1709 | තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1717 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1718 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 1729 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1729 | විවිධ දැන්වීම් ... ... ... | 1732 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

දීමනා.—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7 1/2 කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබිම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙසු සැන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

**ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

**ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයෙ.
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

කාල සීමාවක් II පෙළ සැලසුම්කරුවෙකු වශයෙන් දෙපාර්තමේන්තුවට සේවය කිරීමටත් බැඳෙමින් දෙපාර්තමේන්තුව සමග ගිවිසුම් පත්‍රයකට ඇතුලත් විය යුතුවේ. මෙම කොන්දේසි හරියාකාර පිළිපැදීම සඳහා පුහුණුව ලබන්නන් සහ ඔවුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන්, ඇපකරුවන් දෙදෙනෙකු ද ඇතු ව රු. 5,000 ක බැඳුම්කරයකට ඇතුලත් විය යුතුය.

7. **සේවා කොන්දේසි.**—(i) තෝරාගනු ලැබූ ඉහත 4 ඡේදයේ (ii) (අ) යටතේ සුදුසුකම් ලබන අපේක්ෂකයින්, දෙපාර්තමේන්තුවේ දෙවසියක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතු අතර, 4 ඡේදයේ (ii) (ආ) යටතේ සුදුසුකම් ලබන්නෙක් එක් වසියක ප්‍රායෝගික පුහුණුවක් ලැබිය යුතුය.

(ii) ප්‍රායෝගික පුහුණුව සාර්ථක ලෙස අවසන් කිරීමෙන් සහ නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණයකින් සමත් වීමෙන් පසුව අයදුම්කරුවන් ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත II පෙළේ සැලසුම්කරු තනතුරුවලට පත් කරනු ලැබේ.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට කායසීල ඇතුලත මෙන් ශ්‍රී ලංකාවේ ඕනෑම තැනක ද රාජකාරි කිරීමට නියම කරනු ඇත.

8. රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් නම් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී අයදුම්කරු මෙම පත්වීම සඳහා නිදහස් කළ හැකිද, නොහැකිද යන වග ද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සඳහන් කළ යුතුය.

9. අයදුම්පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්) පළාත් පාලන අමාත්‍යාංශයේ, ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශය, රත්මලාන, යන ලිපිනයට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

10. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

11. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

ඩබ්ලිව්. පත්මනාදන්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ආයතන හා ගිණුම්).

පළාත් පාලන අමාත්‍යාංශයේ,
ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන
වැඩ අංශය,
රත්මලාන. 1969.9.29.

## ආදර්ශ ඉල්ලුම් පත්‍රය

**පළාත් පාලන අමාත්‍යාංශයේ, ජලසම්පාදන, ජලාපවහන සහ පළාත් පාලන වැඩ අංශයේ ආධුනික සැලසුම්කරු තනතුරු**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   (අ) වාසගම :————.
   (ආ) වෙනත් නම් :————.

2. තැපැල් ලිපිනය :————.

3. උපන් දිනය :————.

   අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :—
   අවුරුදු :——, මාස :——.

4. පුරවැසිභාවය හා එය ලබාගත් අන්දම :—
   (අ) පරම්පරාවෙන් :————.
   (ආ) ලියාපදිංචිවීමෙන් (ලියාපදිංචිවීමෙන් පුරවැසි භාවය ලබා ඇත්නම්, එම සහතිකයේ අංකය හා දිනය සඳහන් කළ යුතුය) :————.

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරුගේ :————.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :————.
   (ඇ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තාගේ :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තාගේ :————.

6. විවාහක ද අවිවාහක ද යන වග :————.

7. අධ්‍යාපනය ලබා ඇති පාසැල් හෝ විද්‍යාලයන්හි නම් (ඇතුල්වූ දිනයන් හා අස්වූ දිනයන් සඳහන් කළ යුතුය) :————.

8. අධ්‍යාපනික සුදුසුකම් (එම සුදුසුකම් ලබාගත් දිනයන් සඳහන් කළ යුතුය) :—
   (අ) සාමාන්‍ය අධ්‍යාපනය :————.
   (ආ) වෘත්තීය හෝ කාර්මික සුදුසුකම් :————.

9. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස්වූ පසු කරන ලද රැකියාවන් (බැඳුණ හා අස්වූ දිනයන් සඳහන් කළ යුතුය) :————.

10. විශේෂ අභිරුචිකම්, සුදුසුකම්, පුහුණුවීම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

11. සිංහල හා දෙමළ පිළිබඳව ලබාගෙන ඇති උසස්ම සුදුසුකම් : ————.

12. දැන්වීමේ 4 (ii) ඡේදයේ කුමන උප ඡේදයක් යටතේ ඔබ සුදුසුකම් ලබා ඇත්ද ?

13. වෙනත් කරුණු :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි ම විසින් සඳහන් කර තිබෙන සියළු විස්තර සත්‍ය වූද, නිවැරදි වූද කරුණු බව මෙම මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත් තෝරා බඳවා ගැනීමට පෙර වරද අනාවරණය වී නම්, නුසුදුස්සෙකු වීමට ද බඳවා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරන බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

10–390—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

## වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව

### ශබඩා නිලධාරීන්ගේ තනතුරු

වෙළඳ ද්‍රව්‍ය මිලයට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම දැන්වීමේ අග දැක්වෙන ආදර්ශ ආකෘතියේ ආකාරයට සැපයිය යුතු ඉල්ලුම්පත් 1969 ඔක්තෝබර 27 වැනි දින නොයික්මවා ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන්, කොළඹ 1, මිලර්ස් ගොඩනැගිල්ලේ, සිව් වැනි මාලයේ පිහිටි වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාතීමේන්තුවේ කොමසාරිස් වෙත එවිය යුතුය. ආකෘති පත්‍ර සපයනු නොලැබේ.

2. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම යට දැක්වෙන අවශ්‍යතා සතු බව ඔප්පුවෙන සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1969 ඔක්තෝබර් 27 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

(ආ) පහත සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ වැඩි ගණනක් තිබිය යුතුය. කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සාමාර්ථය සහ,

(1) රබර් වර්ග කිරීම පිළිබඳව මනා දැනුමක් සහිතව, ලංකාවෙන් පිටරට යවන වෙළඳ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ/හෝ වර්ග කිරීම පිළිබඳව දස වසක පළපුරුද්දක් තිබිය යුතුය ; හෝ

(2) රබර් පමණක් නිෂ්පාදනයෙහි සහ/හෝ වර්ග කිරීමෙහි දස වසක පළපුරුද්දක් තිබිය යුතුය ;

(3) මනා චරිතයකින්ද කායික සෞඛ්‍යයෙන් ද යුක්ත බව.

3. **වැටුප් පරිමාණය.**—වාර්ෂික වැටුප රු. 1,620 න් පටන් ගෙන රු. 120 වාර්ෂික වැඩිවීම් 12 ක් ඇතිව රු. 3,060 තෙක් වැඩිවේ.

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි හා සේවා කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය.

(i) සේවයට බඳවා ගත් අපේක්ෂකයින්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවට නැංවීම පිණිසද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවනට අනුකූල වන ලෙස ඔබට නියම කෙරෙනු ඇත.

(ii) ඉදින් සේවය කලින් අවසන් කරනු නොලැබුවහොත් අවුරුදු 3 ට වඩා සේවයේ රඳවා ගැනීම නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම උඩ රඳා පවතිනු ඇත. කෙසේ වුවද, මෙම සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීම නිසාම තෝරාගනු ලබන අපේක්ෂකයින්ට අවුරුදු 3 ට පසුව ද, දීගටම සේවයේ සිටීමට අවශ්‍යයෙන්ම ඉඩ දෙනු ලැබේ යයි අදහස් නොකෙරේ.

(iii) තෝරාගනු ලබන අයදුම්කරුවන් හට ස්ථාවර ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලකින් සහ ආකාරයකින්, ඇපයක් තැබීමට සිදු වෙනවා ඇත.

(iv) තෝරා පත් කරගත් අපේක්ෂකයින් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීමට සූදානම් විය යුතුයි.

[illegible] හා ප්‍රලේඛන මධ්‍යස්ථානය

5. ඉල්ලුම්කරුවන් විසින් තම ඉල්ලුම් පත්‍රයට පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් සහතික නොවේ) පමණක් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහ යටතේ නිකුත් කළ උප්පැන්න සහතික හෝ පිළිගනු නොලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) රබර් නිෂ්පාදනය සහ/හෝ වර්ග කිරීම පිළිබඳ පළපුරුද්දට අදාල සහතික.

(ඈ) අයදුම්කරුගේ සුදුසුකම්, චරිතය හා මෙම තනතුරට පත් කිරීම සඳහා ඇති යෝග්‍යතාවය සඳහන් මෑතකදී ලබාගත් සහතික තුනක් (දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් විසින් එම සහතික ඉදිරිපත් කිරීම අනවශ්‍යයි).

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (ii) වැනි ඡේදයේ ආරම්භයෙහි පළකර ඇති රජයේ සේවයේ තනතුරුවලට කෙරෙන පත්වීම් සඳහා යෙදෙන සමන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කෙරේ.

පී. කාසිලිංගම්,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ කොමසාරිස්.

1969 සැප්තැම්බර් 30,
වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 147,
කොළඹ 1.

## ගබඩා නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් කිරීමේ ආකෘති පත්‍රය

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :—.
(අ) පෙළපත් නම :————.
(ආ) අනික් නම් :————.

(2) ලිපිනය :—

(3) (අ) ජාතිය :————.
(ආ) ඔබ ලංකාවේ පුරවැසියෙක් ද යන බව සඳහන් කරන්න—
(i) පරම්පරාවෙන් ද :————.
(ii) ලියාපදිංචි කිරීමෙන් ද :————.

(4) (අ) උපන් දිනය හා 1969.10.27 දිනට නියමිත වයස: ————.

(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිනිය යුතුයි.)

(ආ) විවාහකද අවිවාහකද යන වග :————.

(5) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් හා සමත් වූ විෂයයන් (දිනයන් සමග) :————.

(6) ඉගෙන ගත් පාසැල හා පාසැලෙන් අස්වූ දිනය :————.

(7) නිවේදනයේ 2 (ආ) ඡේදයේ (i) හෝ (ii) හි යොමු කළ පළපුරුද්ද පිළිබඳ විස්තර (එම පළපුරුද්ද තහවුරු කිරීම සඳහා සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)

(8) කියවීම, ලිවීම, කථාකිරීම හා අර්ථ නිරූපණය පිළිබඳ සිංහල ප්‍රවීණතාව :————.

(9) පාසැලෙන් අස් වූ දා සිට කළ රැකියාවන් හා ඒ සම්බන්ධ වූ සේවා හා දිනයන් පිළිබඳ විස්තර :————.

(10) චරිත සහතික ලබාගත් අයගේ නම් හා ලිපිනයන් (එම සහතික පත්‍රවල මුල් ලිපි නොව පිටපත් ඉල්ලුම්පතට ඇමිණිය යුතුය) :————.

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද විස්තර සත්‍ය බවත් නිවැරදි බවත් සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍ය හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව, මා තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවන් ම එම තනතුරට නුසුදුස් සෙකු බවට පත්කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ ඇති බැව් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-433—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සංචාරක මණ්ඩලය

### ඇබෑර්තු

ලංකා සංචාරක මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ :—

සහකාර අධ්‍යක්ෂවරු
පාලන සහායකවරු/ප්‍රවෘත්ති සහායකවරු
ලඝු ලේඛක

(1) **සහකාර අධ්‍යක්ෂවරු.**—වැටුප් ක්‍රමය : සියළු දීමනා ඇතුව මසකට රු. 600—10×40, 4×50=රු. 1,200. සුදුසුකම් සහ පළපුරුද්ද අනුව තෝරාගත් අපේක්ෂකයා මෙම වැටුප් ක්‍රමයේ සුදුසු අංශයක තැබිය හැක.

**සුදුසුකම්.**—සෑම අපේක්ෂකයෙකුම ඔහු/ඇය,

(අ) 1969 ඔක්තෝම්බර් 1 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු යසිද, අවුරුදු 40 ට නොවැඩි යැසිද,

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, සංඛ්‍යා විද්‍යාව, ගණිතය හෝ සමාජ විද්‍යාව යන විෂයයන් ගෙන් ගෞරව උපාධියක් ලබා ඇති උපාධිධරයකු හෝ ඒ හා සමාන සුදුසුකම් ඇත්තකු යැයි, සාක්ෂි සැපයිය යුතුය.

**අමතර සුදුසුකම් :**

(අ) යෝජනා ක්‍රම අගය කිරීම සහ වැඩ සටහන් සකස් කිරීම පිළිබඳ පුහුණුවක් සහ පළපුරුද්දක්,

(ආ) පහත සඳහන් භාෂා අතුරින් එකක හෝ ඊට වැඩි ගණනක ක්‍රියාකාරී දැනුම—

ජර්මන්, ප්‍රංශ, ඉතාලි, ස්පාඤ්ඤ, රුසියානු.

ඉහත දැක්වෙන කවර සුදුසුකමක් හෝ මතු දැක්වෙන අපේක්ෂකයින් සඳහා ලිහිල් කළ හැකිවේ :—

(අ) විශේෂ අමතර සුදුසුකම් ඇති අපේක්ෂකයින්,

(ආ) රජයේ සේවයේ හෝ පුද්ගලික අංශයේ අඩු ගණනේ පස් වසරකට නොඅඩු කාලයක වගකිව යුතු තනතුරු දරා ඇති අපේක්ෂකයින්,

(ඇ) දැනට මණ්ඩලයේ සේවයේ යෙදී සිටින පාලන සහායකයින්, ප්‍රවෘත්ති සහායකයින් හෝ ඒ හා සමාන ශ්‍රේණිවල නියුතු නිලධාරීන්.

(2) **පාලන සහායකවරු/ප්‍රවෘත්ති සහායකවරු.**—වැටුප් ක්‍රමය : සියළු දීමනා ඇතුළුව මසකට රු. 350—25—800. සුදුසුකම් සහ පළපුරුද්ද අනුව තෝරාගත් අපේක්ෂකයා මෙම වැටුප් ක්‍රමයේ සුදුසු අංශයක තැබිය හැක.

**සුදුසුකම්.**—සියළුම අපේක්ෂකයින් විසින්, ඔහු/ඇය,

(අ) 1969 ඔක්තෝම්බර් 1 වැනි දිනට වයස අවුරුදු 22 වත්, අවුරුදු 30 වත් අතර වේ යැයි,

(ආ) අධ්‍යයන පොදු සහතික 'උසස් පෙළ' පරීක්ෂණයෙන් අඩු ගණනේ විෂයයන් තුනකින් සමත්ව ඇතැයි හෝ ඒ හා සමාන සුදුසුකම් ඇතැයි, සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

**අමතර සුදුසුකම් :**

(අ) ලංකාවේ ඉතිහාසය, සංස්කෘතිය සහ ආර්ථිකය පිළිබඳ දැනීමක්,

(ආ) ඉංග්‍රීසි භාෂාව පිළිබඳ මනා දැනීමක්,

(ඇ) පහත දැක්වෙන විදේශීය භාෂා අතුරින් එකක හෝ ඊට වැඩි ගණනක ක්‍රියාකාරී දැනුම—

ප්‍රංශ, ජර්මන්, ඉතාලි, ස්පාඤ්ඤ හෝ රුසියානු.

ඉහත සඳහන් කවර සුදුසුකමක් හෝ මතු දැක්වෙන අපේක්ෂකයින් සඳහා ලිහිල් කළ හැකිවේ :—

(අ) අඩු ගණනේ අවුරුදු දෙකකට නොඅඩු කාල සීමාවක් තුළ සංචාරක ව්‍යාපාරයේ වගකිව යුතු තනතුරු දරා ඇති අපේක්ෂකයින්, සහ

(ආ) ලංකා සංචාරක මණ්ඩලයේ සේවකයින්.

**ලඝු ලේඛක—II වැනි ශ්‍රේණිය—ඉංග්‍රීසි**

**වැටුප් ක්‍රමය.**—සියළු දීමනා ඇතුළුව මසකට රු. 230—4×රු. 10—14×රු. 15—රු. 480. සුදුසුකම් සහ පළපුරුද්ද අනුව තෝරාගත් අපේක්ෂකයා මෙම වැටුප් ක්‍රමයේ සුදුසු අංශයක තැබිය හැක.

**සුදුසුකම්.**—සියළුම අපේක්ෂකයින් ඔහු/ඇය විසින්,

(අ) 1969 ඔක්තෝබර් 1 වැනි දිනට අවුරුදු 25ට නොවැඩි බවත්,

(ආ) විෂයයන් හතරකින් සම්මාන ඇතිව, වාර දෙකකට නොවැඩි ගණනකදී, අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ පරීක්ෂණයෙන් විෂයයන් හයකින් සමත්වී ඇති බවත්,

(ඇ) වේගය—විනාඩියකට අඩුගණනේ වචන 80 ක් ලඝු ලේඛන ගත කිරීමටත්, විනාඩියකට වචන 30 ක යතුරු ලේඛන ගත කිරීමට හැකි බවටත්, සාක්ෂි සැපයිය යුතුය.
සිංහල ලඝු ලේඛනය සහ යතුරු ලේඛනය පිළිබඳ දැනුමක් ඇති අපේක්ෂකයින් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

2. **ඉහත සඳහන් තනතුරුවලට අදාල සේවා කොන්දේසි.**—(1) තෝරාගත් අපේක්ෂකයා දැනට රජයේ සේවයේ නියුතු නිලධාරියෙකු නොවේ නම්,

(අ) අවුරුදු 3 ක ආධුනික සේවා කාලයකට යටත් විය යුතුය.

(ආ) ශාරීරික යෝග්‍යතාවය පිළිබඳ අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(2) තෝරාගත් අපේක්ෂකයා විදේශයෙහි සේවය සඳහා පත් කෙරේ නම්, එවැනි විදේශීය රටක සේවය සඳහා ඔහු යෝග්‍ය යයි දක්වෙන වෛද්‍ය සහතිකයක් සැපයිය යුතුය.

(3) තවද, තෝරාගත් අපේක්ෂකයා—

(අ) මණ්ඩලය විසින් සකස් කර ඇති හෝ ඉදිරියට සකස් කෙරෙන නීතිරීතිවලට අනුකූලතාවය දක්විය යුතුය.

(ආ) නියමිත කාල සීමාවක් තුළ, මණ්ඩලය විසින් නියමිත මට්ටමක, සිංහල ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

(ඇ) සේවක අර්ථසාධක අරමුදලට හෝ මණ්ඩලීය අර්ථ සාධක අරමුදලක් ඇති කළහොත් හෝ එවැන්නක් ඇති කළ විටක එයට දායකයෙකු විය යුතුය.

(ඈ) මණ්ඩලය විසින් නියම කරනු ලැබුවහොත් ඒ අනුව අවශ්‍ය යැයි දක්වෙන ඇප ඉදිරිපත් කළ යුතුය.

3. රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල නිලධාරීන්ගේ ඉල්ලුම් පත් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හෝ සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

4. **ඉල්ලුම් පත් සමග සහතිකපත්වල මුල් පිටපත් ඉදිරිපත් නොකළ යුතුය.**

5. සියළුම ඉල්ලුම් පත්, 1969 ඔක්තෝබර් 26 වැනි දින හෝ ඊට පෙර, කොළඹ, තැ. පෙ. අංක 1504, ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති වෙත, ලැබෙන්නට සැලැස්විය යුතුය.

6. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන ‘තනතුර’ සඳහන් කළ යුතුය.

7. **මෙය උදෙසා කුමන ක්‍රමයේ හෝ අයුතු බලපෑම් ඉල්ලුම් පත අයෝග්‍යවීමට හේතුවනු ඇත.**

සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය.

1969 ඔක්තෝබර් 2 වැනි දින,
තැ. පෙ. 1504,
කොළඹ.

10–511—69.10.9. දින අංක 14,855 දරණ ග සට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව
### පිරිස් නිලධාරි තනතුර

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ පිරිස් නිලධාරි තනතුරක් සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ලාංකිකයින්ගෙන් අයැදුම් පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්.**—අයැදුම්කරුවන්—

(1) වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය;

(2) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සමග පිරිස් සේවා, කම්කරු පාලනය හා කාර්මික සම්බන්ධතා වැඩ සම්බන්ධව සිව් අවුරුදු පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර;

(3) සියලුම කම්කරු නීති හා පඩිපාලක සභා තීරණ පිළිබඳ මනා දැනුමක් ද තිබිය යුතුය ෂ

(4) සේවක මණ්ඩල පාලනය, කම්කරු විනිශ්චය සභා හා විනයානුකූල පරීක්ෂණ කටයුතු සම්බන්ධව පළපුරුද්දක් බබාතිබීම හ සිංහල භාෂාව පිළිබඳ මනා දැනුමක් හා විනයානුකූල පරීක්ෂණ සිංහලෙන් පැවැත්වීමට හැකියාව තිබිය යුතුය.

**වැටුප් ක්‍රමය :**—රු. 800—රු. 45×7—රු. 1,115 (සියල්ල අඩංගු මාසික)

රජයේ/සංස්ථා/මණ්ඩල සේවකයන්ගේ අයැදුම් පත් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු අතර, අයැදුම්කරුවන් ඉහත සඳහන් තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු තම සංස්ථාවේ/මණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ සේවයෙන් මුදා හරින බවට එකී දෙපාර්තමේන්තු ප්‍රධානයා එකඟ විය යුතුය.

මේ සඳහා අවශ්‍ය අයැදුම් පත් මෙම සංස්ථාව මගින් නිකුත් කරනු ලැබේ. මෙම කාර්යාලයට පැමිණ හෝ තැපැල් මගින් ලබාගත් අයැදුම් පත් මගින් පමණක් ඉල්ලුම් කළ යුතු අතර, නිසිලෙස සම්පූර්ණ කරන ලද අයැදුම් පත් 1969 ඔක්තෝබර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර, “සභාපති, ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව, තැ. පෙ. 670, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 5.” යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තැපෑලේදී නැතිවන හෝ ප්‍රමාද වන අයැදුම් පත් ගැන සංස්ථාව වග කියනු නොලැබේ.

තැපැල් මගින් අයැදුම් පත් ලබා ගැනීමට බලාපොරොත්තු වන අයට ශත 10 ක මුද්දරයක් ගසන ලද 9″×4″ ප්‍රමාණයේ, ලිපිනය ලියන ලද ලියුම් කවරයක් එවීමෙන් අයැදුම් පත් ලබා ගත හැක.

සේවක මණ්ඩල කළමනාකාර,
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව.

තැ. පෙ. 670,
242, හැව්ලොක් පාර,
කොළඹ 5,
1969 සැප්තැම්බර් මස 24.

10–401—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ 74/එක්ස්. 2154/69.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය
### ගෘහ විද්‍යාව පිළිබඳ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ගෘහ විද්‍යාව පිළිබඳ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1969 ඔක්තෝබර් මස 24 වැනි දා.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1969 ඔක්තෝබර් මස 31 වැනි දා.

සටහන් :—

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″×4″ ප්‍රමාණයට කුඩා නොවූද තම ලිපිනය ලියන ලද්ද වූ ද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභානි අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නතම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයන් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතු වෙයි.

## ලංකා සංචාරක මණ්ඩලය

### උප විද්‍යාලයාධිපති තනතුර—සංචාරක ව්‍යාපාරික පාසැල

ලංකා සංචාරක මණ්ඩලයේ, සංචාරක ව්‍යාපාරික පාසැලෙහි, උප විද්‍යාලයාධිපති තනතුර සඳහා ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

**අවශ්‍ය සුදුසුකම් :—**

(අ) 1969. 10. 1 දිනට වයස අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 40 ට වැඩි නොවිය යුතුය.

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයකු විය යුතුය.

(ඇ) විශ්ව විද්‍යාලයක හෝ කාර්මික විද්‍යාලයක කථිකාචාර්යවරයකු ලෙස හෝ පාසැලක ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයෙකු ලෙස අඩුගණනේ අවුරුදු 6 ක පළපුරුද්දක් තිබිය යුතුය.

පාසැල් පරිපාලනය පිළිබඳ පළපුරුද්දක් සහ ශිෂ්‍යයිනට ඉංග්‍රීසි සහ ආර්ථික විද්‍යාව ඉගැන්වීමට අවශ්‍ය සුදුසුකම් ඇති අපේක්ෂකයින් කෙරෙහි විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

**වැටුප් ක්‍රමය :—**

සියළු දීමනා ඇතුළුව මසකට රු. 600—10 × රු. 40—4 × රු. 50 —රු. 1,200.

සුදුසුකම් සහ පළපුරුද්ද අනුව තෝරාගත් අපේක්ෂකයාව මෙම වැටුප් ක්‍රමයේ සුදුසු මට්ටමක තැබිය හැක.

**සේවා කොන්දේසි :—**

(1) තෝරාගත් අපේක්ෂකයා රජයේ සේවයේ නිලධාරියකු නොවේ නම්—

(අ) අවුරුදු 2 ක ආධුනික කාලයකට යටත් විය යුතුය.

(ආ) ඔහුගේ ශාරීරික යෝග්‍යතාවය සඳහා වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

(2) තෝරාගත් අපේක්ෂකයා—

(අ) මණ්ඩලය විසින් දැනටමත් සකස්කර ඇති හෝ, මතුවට සකස් කෙරෙන, නීති රීති වලට එකඟ විය යුතුය.

(ආ) නියමිත කාලසීමාවක් ඇතුළතදී, මණ්ඩලය විසින් දක්වා ඇති මට්ටමේ සිංහල ප්‍රවීණතාවයක් ලබාගත යුතුය.

(ඇ) සේවක අර්ථ සාධක අරමුදලට හෝ මණ්ඩලීය අර්ථ සාධක අරමුදලක් ඇති කළහොත් හෝ එවැන්නක් ඇති කළ විට දායකයෙකු විය යුතුය.

(ඈ) මණ්ඩලය විසින් අවශ්‍යයැයි දක්වන ඇප ඉදිරිපත් කළ යුතුය.

රජයේ සේවයේ හෝ රජයේ සංස්ථාවල නියුතු නිලධාරීන්ගේ ඉල්ලුම් පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථා ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**අයැදුම් පත සමග සහතික පත්වල මුල් පිටපත් ඉදිරිපත් නොකළ යුතුය.**

**මෙය උදෙසා කුමන විධියේ හෝ අයුතු බලපෑම් කිරීම, අපේක්ෂකයා නුසුදුස්සකු වීමට හේතුවේ.**

සියළුම අයැදුම් පත්, කොළඹ, තැ. පෙ. අංක 1504, ලංකා සංචාරක මණ්ඩලයේ සභාපති වෙත, 1969 ඔක්තෝබර් 30 වැනි දින හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

අයැදුම්පත බහා එවන කවරයෙහි වම්පස ඉහල කෙලවරේ " උප විද්‍යාලයාධිපති තනතුර " යන්න සඳහන් කළ යුතුය.

සභාපති,
ලංකා සංචාරක මණ්ඩලය.

තැ. පෙ. 1504,
කොළඹ,
1969 ඔක්තෝම්බර් 1.

10-405—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සාප/30/227.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ගුරු විදුහල්වල ශිෂ්‍ය නිවාසාධිකාරි තනතුරු (පිරිමි)

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති ගුරු විදුහල්වල ශිෂ්‍ය නිවාසාධිකාරි තනතුරු සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1969 ඔක්තෝබර් මස 30 වැනි දින හෝ ඊට ප්‍රථම කොළඹ 2, මලයි විදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාවේ) ස්ථිර ලේකම්ට ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—**

(i) තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්කරනු ලබනනන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයන් නම් ආධුනික කාලසීමාව අවුරුදු 3 ක් වන්නේය.

(iii) රජයේ සේවයේ ස්ථිර තනතුරක ස්ථිර කරනු ලැබ සිටින නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහුගේ පත්වීම නියමිත කාලයක වැඩ බැලීමේ පදනම මතය.

(iv) පත්කරනු ලබන්නන් තමාට නියම කරනු ලබන දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කළයුතුයි.

(v) බඳවා ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

3. වැටුප් හා දීමනා:—මෙම තනතුරට අයත් වැටුප් ක්‍රමය, වාර්ෂිකව රු. 1,980—11 × 120 රු. 3,300. රජයේ නීතිරීති අනුව ගෙවල්කුලී දීමනා, ජීවනාධාර දීමනා හා විශේෂ ජීවනාධාර දීමනා ගෙවනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් :—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 25 ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නො ලැබේ.)

(ආ) අංක ගණිතය/ගණිතය, සිංහල/දෙමළ භාෂාව සහ ස්වස්ථතාව ශාරීරික විද්‍යාව ඇතුළු විෂයයන් 6කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) හෝ ඉහත කී විෂයයන් ඇතුළුව ලබා ඇති ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(ඇ) ශිෂ්‍ය නිවාස පරිපාලනය පිළිබඳව පළපුරුද්දක් තිබිය යුතුය.

(ඉ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්තව සිටිය යුතුය.

සටහන : ප්‍රථමාධාර දීම හා සාත්තුසේවය ගැන දැනුමක් හා පළපුරුද්දක් ඇති අයදුම්කරුවන් සම්බන්ධයෙන් විශේෂයෙන් සළකා බලනු ලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය වූ විටෙක ඉදිරිපත් කිරීමට සෑම අයදුම්කරුවෙක්ම සූදානම් විය යුතුය :—

(අ) ලැබූ ඉහලම අධ්‍යාපන සහතිකය.

(ආ) ලබා ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) ශිෂ්‍ය නිවාස පරිපාලනය පළපුරුද්ද සම්බන්ධයෙන් සහතික.

සටහන : (i) ලියකියවිලි හෝ ලියවිලිවල පිටපත් අයදුම් පතට අමුණා නොඑවිය යුතුයි.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ විට ඒවා ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනු නො ලැබේ.

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම්කරුවන් විසින් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත් ස්වකීය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතුය. එසේකුදු වුවත් තම ඉල්ලුම් පත්‍රයේ පිටපතක් කෙළින්ම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ නමට ද එවිය යුතුයි. නියමිත දිනට ප්‍රමාදවී ලැබෙන ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. එහෙත් නියම අවස්ථාවේදී දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාට ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් එසේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් බාරගනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවැනි කොටසේ දෙවැනි ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරු වලට කරනු ලබන පත්වීම් සම්බන්ධ පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. ඉල්ලුම් පත් ලැබුණ බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය පසුවී දින 14ක් ඇතුළත ඉල්ලුම් පත ලැබුණු බවට ලිපියක් නොලදහොත් වහාම ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත දන්විය යුතුය. කිසියම් අයදුම්කරුවකු මේ අවශ්‍යතාවය පැහැර හරින්නේ නම් තම අයදුම් පත්‍රය සලකා බලනුවස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමි වනු ඇත.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969 සැප්තැම්බර් 30 දින,
කොළඹ 2, මාලේ විදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේදී.

## ඉල්ලුම් පත්‍රයේ ආදර්ශ ආකෘතිය

මෙම ඉල්ලුම් පත්‍රය අඟල් $8\frac{1}{2} \times 13\frac{1}{2}$ ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළයුතුයි

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය-ගුරු විද්‍යාලවල ශිෂ්‍ය නිවාසාධිකාරි තනතුරු**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) : ————.
2. ස්ථිර ලිපිනය : ————.
3. ගම් ප්‍රදේශය : ————.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :
   අවු.——— මාස : ———දින : ————.
   උපන් දිනය : ————.
5. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු : ————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා : ————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පියාගේ පියා : ————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පියාගේ පියාගේත් පියා : ————.
6. ලාංකිකත්වය පරම්පරාවෙන් ද, ලියාපදිංචි කිරීමෙන් ද යන වග:———
7. අධ්‍යාපන සුදුසුකම් :—
   (i) සාමාන්‍ය : ————.
   (ii) ශිෂ්‍ය නිවාස පරිපාලනය පිළිබඳ සහතිකවල විස්තර : ————.
   (iii) සිංහලෙන්/දෙමළෙන් සමත් වී ඇති උසස්ම විභාගයේ විස්තර : ————.
8. නිවේදනයේ 4 වැනි ඡේදයේ (ඇ) යටතේ සේවා විස්තර : ————.
   (සේවය කළ ආයතන, සේවා කාලයත්, දරූ තනතුර සඳහන් කළයුතුයි)
9. විවාහකද? අවිවාහකද? වැන්දඹු ද? : ————.
10. කිසියම් අපරාධ වරදක් නිසා අධිකරණය මගින් වරදකරු කරනු ලැබූ වෙද? එසේ නම් (අ) දිනය, (ආ) නඩු නොම්මරය, (ඇ) වරදෙහි ස්වභාවය සඳහන් කරන්න : ————.
11. මුදල් කරදරවලින් නිදහස් ද? එසේ නොවේ නම්, ඔබේ ණය තුරුස්වල ප්‍රමාණය කොපමණ ද? : ————.
12. ඔබට විරුද්ධව විනයානුකූලව කටයුතු කර තිබේද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.
13. සේවා මුක්ත භටයෙක් වී නම් (අ) සේනාංකය, (ආ) නිලය, (ඇ) සේව යට බැඳුණු හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර : ————.
14. පාඨශාලාවෙන් අස්වූ දින සිට යෙදී සිටි රැකීරක්ෂා :—
   (i) දරන ලද තනතුර : ————.
   (ii) නියුක්තව සිටි වකවානුව : ————.
   (iii) අස්වීමට හේතුව : ————.
15. ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලන ආයතනයන් යටතේ හෝ කලින් ස්ථිර හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිට, එම සේවය යම් අවස්ථාවකදී නතර කරන ලද්දේ නම් :
   (අ) එම රක්ෂාව පිළිබඳ විස්තර : ————.
   (ආ) සේවයේ යෙදී සිටි කාලය : ————.
   (ඇ) සේවය නතර කිරීමට හේතු : ————.
16. දැනට යෙදී සිටින රක්ෂාව :
   (i) ආයතනය : ————.
   (ii) තනතුර හා ශ්‍රෙණිය : ————.
   (iii) ඊට පත් වූ දිනය : ————.
   (iv) විශ්‍රාම වැටුප් සහිත ද? තාවකාලික හෝ අනියම්ද? : ————.
   (v) දීමනා රහිතව දැනට ලැබෙන වැටුප හා වැටුප් ක්‍රමය : ————.
   (vi) මීළඟ වැටුප් වැඩිවීමේ දිනය : ————.
17. වෙනත් කරුණු : ————.
18. මේ අයදුම් පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුව හොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත්, මම දනිමි.

————,
දිනය : ———— අයදුම්කරුගේ අත්සන.

**දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය**

මගේ අංකය : ————.
ඔබේ අංකය : සාප/30

අධ්‍ය. සං./ලේ.

මෙම අයදුම් පත මෙම කාර්යාලයට ලැබී ඇත්තේ අයදුම්පත් බාර ගන්නා අවසාන දිනට පසුය/පෙරය*

ඉල්ලුම් පත්‍රයේ සඳහන් ————————අංකිත ඡේදවල විස්තර නිවැරදි බැව්/පහත සඳහන් සංශෝධනයන්ට යටත් බැව්* මෙයින් සහතික කොට ඉදිරිපත් කරමි.

————————————————————

————————————————————

————————————
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගෙ අත්සන,
පදවි නාමය : ————.

දිනය : ————.

(*අදාල නැති කොටස් කපා හරින්න.)

10-504—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### පහළ ශ්‍රේණියේ මේට්‍රන් තනතුරක්

රාජකීය ලංකා ගුවන් හමුදාවේ, සුදුසුකම් ලත් මේට්‍රන් තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත් පහත සඳහන් ආදර්ශ ආකෘති පත්‍රයෙහි පිළියෙල කර, 1969.10.26 දිනට පෙර මට ලැබෙන සේ එවිය යුතුය.

**වැටුප්.**—වර්ෂයකට රු. 5,448 න් පටන් ගෙන රු. 144 බැගින් වූ වාර්ෂික වේතනාධික සහිතව වර්ෂයකට රු. 5,880 ක් දක්වා වැඩිවේ.

තෝරාගනු ලබන අයදුම්කාරියන් පහත සඳහන් දැයට හිමිකම් ලැබෙනු ඇත :—

(i) වර්ෂයකට රු. 60 ක ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාවක්.

(ii) වර්ෂයකට රු. 30 ක පාවහන් සඳහා දීමනාවක්.

(iii) සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ හෙදියන්ට නිකුත් කරන ප්‍රමාණයට නොමිලේ නිල ඇඳුම්.

**2. වයස් සීමාව.**—අයදුම්කාරියන්ට පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(i) 1969.10.26 දිනට වයස අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි. (දැනටමත් රජයේ සේවයේ නියුතු අය කෙරෙහි ඉහළ වයස් සීමාව බල නොපානු ඇත.)

**3. සුදුසුකම් :**

(i) හෙදියන් ලෙස මූලික සුදුසුකම් සහිත පිළිගත් හෙදි විද්‍යාලක සහතිකයක් තිබිය යුතුයි.

(ii) වෛද්‍ය මණ්ඩලයේ ලියා පදිංචි වූ හෙදියක් විය යුතුය.

(iii) වෛද්‍ය ආඥා පණතේ (105 වැනි අධිකාරයේ) (vii) වැනි ඡේදය යටතේ ලියා පදිපදිංචිවූ වින්නඹු සේවිකාවක් විය යුතුය.

(iv) සුදුසුකම් ලත් හෙදියක් වශයෙන් අවුරුදු පහක අඩුම සේව යක් තිබිය යුතුය. වාට්ටුවල සහ ආරෝග්‍යශාලාවල පාලනය පිළිබඳ පළපුරුද්දක් ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(v) මනා චරිතයකින් සහ හොඳ ශාරීරික සෞඛ්‍යයෙන්ද යුක්ත විය යුතුයි.

**4. බඳවා ගැනීමේ වගන්ති.**—මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය. අංක 372 හා 57.4.29 දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, විශ්‍රාම වැටුප් සහිත තත්ත්වය ප්‍රදානය කිරීම පාලනය වනු ඇත.

5. අයදුම්කාරියන් සිය අයදුම්පත්වලට පහත සඳහන් ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බෞතීස්ම සහතික හෝ අධ්‍යාපන නීති මාලාව යටතේ පාසැල්වල භාවිතය සඳහා නිකුත් කරනු ලබන ලුහුඬු උප්පැන්න සහතිකය හෝ මේ සඳහා භාරගනු නොලැබේ.

(ආ) අයදුම්කාරියගේ චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් චරිත සහතික තුනක් (දැනටමත් රජයේ සේවයේ නියුක්තවූවන් ගෙන් මෙය අවශ්‍ය නොවේ.)

(ඇ) අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික.

**සටහන :** ඉල්ලුම්පත්වලට අමුණා එවන කිසිම ලියවිල්ලක් ආපසු එවනු නොලැබේ.

6. ඉල්ලුම් පත් කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, තැ. පෙ. 594, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක නිළධාරි හා ගණකාධිකාරී, වෙත එවිය යුතුයි. මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිළධාරියෙකුගේ පෞද්ගලික නාමට ඉල්ලුම් පත් නොඑවිය යුතුයි.

7. රාජ්‍ය සේවයේ නියුක්තවූවන්ගේ ඉල්ලුම් පත් තම තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුයි.

8. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (II) ඡේදයේ මුල පළකොට ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා කරන පත්වීම්වලට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැළකිල්ල යොමු කරවනු ලැබේ.

9. ඉහත සඳහන් සියලුම සුදුසුකම් නොමැති අයදුම් කාරියන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ඒ. සී. අරසත්නම්,
සිවිල් පාලක නිළධාරි හා ගණකාධිකාරී,
ගුවන් හමුදා අණදෙන නිළධාරි වෙනුවට.

මූලස්ථානය,
රා. ලං. ගු. හ,
තැ. පෙ. 594,
කොළඹ, 1969 සැප්තැම්බර් මස 30 වැනි දින

## ආදර්ශ ආකෘති පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරින්) :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය හා වයස (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
4. ජාතිය (ලාංකිකයෙකු වන්නේ පෙළපතින්ද නැතහොත් ලියාපදිංචිවීමෙන්ද යන වග සඳහන් කරන්න.) :————.
5. විවාහකද, අවිවාහකද යන වග :————. (විවාහක නම් පහත සඳහන් තොරතුරු සපයන්න) :—
   (අ) කන්‍යා නාමය (විවාහයට පෙර නම) :————.
   (ආ) සවාමි පුරුෂයා ජීවත්ව සිටීද :————.
   (ඇ) 1. සවාමිපුරුෂයා සමග ජීවත් වන්නේද යන වග :————.
   2. නීත්‍යානුකූලව වෙන්වී සිටීද යන වග :————.
   3. නීත්‍යානුකූලව නොවේ නම් වෙන්වී සිටින්නේ කෙසේද : ————.
   4. සවාමිපුරුෂයාගේ රැකියාව :————.
   5. ඔහු රැකියාව කරන ස්ථානය :————.
   6. ළමයින් ගණන :————.
   (අ) වැඩිමහල් ළමයාගේ වයස :————.
   (ආ) බාලම ළමයාගේ වයස :————.
6. දැනටමත් සේවයේ යෙදී සිටී නම්—
   (අ) දැනට රැකියාව කරන ස්ථානය :————.
   (ආ) සේවා කාලය අවුරුදු කීයද ?:————.
7. අධ්‍යාපනය ලැබූ පාසැල් හා සමත්වූ විභාග විස්තර :————.
8. ලැබූ පුහුණුව පිළිබඳ විස්තර දින සහිතව :————.
9. සූතිකා කර්මය පිළිබඳව පුහුණුව ලබා ඇතිද යන වග :————. (සහතිකයේ පිටපතක් අමුණන්න.)
10. චරිත සහතික ලබා ගත්තේ යමෙකුගෙන්ද, ඒ අයගේ නම් හා ලිපිනය (මෑතකදී ලබාගත් චරිත සහතික තුනක පිටපත් අමුණන්න ):————.
11. පියාගේ හෝ භාරකරුගේ නම සහ ලිපිනය :————.
12. පහත සඳහන් දැ පිළිබඳ දැනුම :—

| | කියවීම | ලිවීම | කථා කිරීම |
|---|---|---|---|
| සිංහල | ————. | ————. | ————. |
| දෙමළ | ———— | ———— | ———— |
| ඉංග්‍රීසි | ———— | ———— | ———— |

13. මීට පෙර රජය යටතේ සේවය කර ඇත්නම්, ඒ පිළිබඳ විස්තර සපයන්න :————.
14. හෙදියක වශයෙන් ලියා පදිංචි වී ඇති අංකය (සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

මා රජයේ සේවයේ හෝ වෙනත් ආයතනයක සේවයේ අකාර්යක්ෂමතාවය නිසා විශ්‍රාම නොගන්වන ලද බවද, සේවයෙන් පහ නොකරන ලද බවද, සාපරාධී වරදකට උසාවියකින් වරදකාරියක් නොකරන ලද බවද, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් හෝ තොරතුරු අසත්‍ය බව සොයා ගනු ලැබුවහොත් ඊට ලැබෙන දඬුවම, වහාම මා රාජ්‍ය සේවයෙන් පහ කිරීම බව මම දනිමි.

————.
අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

10–375–69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

අංකය : පීආර්/6/2.

## මහා භාණ්ඩාගාරයේ පරිපාලන අභ්‍යාස ආයතනය

### රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය—1970

පරිපාලන අභ්‍යාස ආයතනය මගින් පවත්වනු ලබන රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය සඳහා වූ සිව්වැනි පාඨමාලාව 1970 පෙබරවාරි මාසයේ දී ආරම්භ වනු ඇත. පාඨමාලාවට අභ්‍යාසලාභීන් තෝරීම සඳහා රජයේ ගණකාධිකාරී සේවයෙහි නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන් 69.12.31 වෙනි දිනට වයස අවුරුදු 49 ට අඩු විය යුතුය.

2. අභ්‍යාස පාඨමාලාවෙහි විස්තර පහත දැක්වෙයි :—

(i) රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය කොටස් දෙකකින් සමන්විත වෙයි. පාඨමාලාවෙහි පළමුවන කොටස පස් මසක්ද දෙවන කොටස සිව් මසක්ද පැවැත්වෙයි.

(ii) දේශනාවලට අමතර වශයෙන් ප්‍රායෝගික පුහුණුව, වැදගත් ස්ථාන නැරඹීමට යාම, ගෙදර වැඩ සහ පරීක්ෂණ ද ඇතුළත් වනු ඇත.

(iii) පාඨමාලාව සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින්ට පාඨමාලාව පැවැත්වෙන කාලය සඳහා, එනම්, නව මාසයකට, සම්පූර්ණ පඩි සහිත නිවාඩු දෙනු ඇත.

(iv) II වන කොටසෙහි පාඨමාලාව හැදෑරීම සඳහා අවසර දීමට පෙර අභ්‍යාස ලාභීන් I වන කොටසෙහි සියළුම විෂයයන්ගෙන් සමත්විය යුතුය. I වන කොටසෙහි හෝ II වන කොටසෙහි විභාගය සඳහා දෙවරකට වැඩියෙන් පෙනී සිටීමට කිසිම අපේක්ෂකයෙකුට අවසර නොදෙනු ඇත.

(v) පාඨමාලාව පැවැත්වෙන කාලය තුළදී, අභ්‍යාසලාභීන්ගේ ප්‍රගතිය විභාග කර බැලීම සඳහා මාස්පතා පරීක්ෂණ පවත්වනු ඇත. මධ්‍යස්ථ කිරීමේ කමිටුව මගින් තීරණය කරනු ලබන පරිදි, කිසියම් අභ්‍යාසලාභියකු පිට පිටම පරීක්ෂණ දෙකකින් අසමත් වුවහොත් ඔහු පාඨමාලාවෙන් ඉවත් කරනු ඇත.

(vi) පාඨමාලාවේ නිර්දේශ පත්‍රිකාව පහත දැක්වෙයි :—

I වන කොටස (මාස 5)

උසස් ගණන් තැබීම
ගණන් පරීක්ෂණය
පිරිවැය ගණන් තැබීම
සාමාන්‍ය වාණිජ දැනුම
නීතිය
රාජ්‍ය මුදල් හා ආර්ථික විද්‍යාව
සංඛ්‍යාලේඛන විද්‍යාව

II වන කොටස (මාස 4)

රාජ්‍ය මුදල් පරිපාලනය
පරිපාලන ගණන් තැබීම—සාමාන්‍ය
පරිපාලන ගණන් තැබීම—පිරිවැය කිරීම
කාර්යාල පාලනය
පරිපාලනය පිළිබඳ මූලධර්ම හා පුහුණුව

(vii) I වන කොටසෙහි ප්‍රශ්න පත්‍ර 7ක්ද, II වන කොටසෙහි ප්‍රශ්න පත්‍ර 5 ක්ද ඇත.

(viii) ඒ ඒ ප්‍රශ්න පත්‍රයෙන් සමර්ථවීමේ මට්ටම සියයට 40 ක් හෝ මධ්‍යස්ථ කිරීමේ කමිටුව මගින් තීරණය කරනු ලබන පරිදි වන්නේ ය. විභාගයෙන් සමත්වීම සඳහා අපේක්ෂකයෙකු එක එක ප්‍රශ්න පත්‍රයෙන් සමත් වී ප්‍රමාණවත් ඓක්‍යයක් ලබාගත යුතුය.

(ix) පාඨමාලාව සාර්ථක අන්දමින් නිම කළ පසු රාජ්‍ය මුදල් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා උපාධියක් අභ්‍යාසලාභීන්ට ප්‍රදානය කරනු ඇත.

(x) පළමුවන ප්‍රයත්නයේදීම රාජ්‍ය මුදල් පරිපාලනය ඩිප්ලෝමා උපාධිය ලබාගන්නා සෑම නිලධාරියෙකුටම අවුරුදු පහක් යනතුරු රු. 50 ක විශේෂ මාසික දීමනාවක් ගෙවනු ඇත.

(xi) පාඨමාලාව සඳහා තෝරාගනු ලබන සෑම නිලධාරියකුම අංකය 627 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව ගිවිසුමක් අත්සන් කළ යුතුය.

3. ආදර්ශ ආකෘතිපත්‍රය අනුව සකස්කොට ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළයුතු අයදුම්පත් 1969.11.7 හෝ ඊට පෙර පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ, 32, ග්ලෙන් ආබර් පෙදෙස, කොළඹ 3 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

පුහුණු කිරීමේ වියදම සඳහා වූ ගාස්තුව ගෙවීමෙන් මෙම අභ්‍යාස පාඨමාලාව හැදෑරීම සඳහා නිලධාරීන් එවීමට සංස්ථාවලටද පුළුවන. ගාස්තු පිළිබඳ විස්තර පහත අත්සන් කරන අයගෙන් ඉල්ලුම් කොට ලබාගත හැකිය.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ,
භාණ්ඩාගාරයේ ලේකම් වෙනුවට.

**රාජ්‍ය මුදල් පරිපාලන ඩිප්ලෝමා උපාධිය,—1970**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
   පෙළපත් නමට යටින් ඉරක් අඳින්න)

2. වයස :————. උපන් දිනය :————.

3. දෙපාර්තමේන්තුව සහ සම්පූර්ණ ලිපිනය :————.

4. රජයේ ගණකාධිකාරී සේවයට ඇතුලත් වූ දිනය :————.

5. දැනට සිටින පන්තිය සහ එම පන්තියට ඇතුල් වූ දිනය : ————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. හැදෑරී පාඨමාලාවන් සහ ලැබූ පුහුණුවීම් ඇතුළු වෙනත් සුදුසුකම් :————.

————,
අත්සන.

දිනය :————. ...............

10–391—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊ 1/69.

**ගණකාධිකාරී සේවයේ IV වැනි පන්තියට පත් කිරීමේ විභාගය—1969**

1969 මැයි 22 වැනි දිනැති අංක 14,855 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1969 මැයි 14 වැනි දිනැති නිවේදනය අනුව, 1969 අගෝස්තු 25 වැනි දින පවත්වන ලද ගණකාධිකාරී සේවයේ IV වැනි පන්තියට පත් කිරීමේ විභාගය අවලංගු කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම ගැසට් නිවේදනයේ නියමයන් හා කොන්දේසි යටතේ 1969 නොවැම්බර් මස 7 වැනි දින විභාග කොමසාරිස් විසින් අළුත් විභාගයක් පවත්වනු ලැබේ.

ප්‍රවේශ පත්‍ර හා කාල සටහන් විභාග කොමසාරිස් විසින් යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

බී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1969 සැප්තැම්බර් මස 28 වැනි දින,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
කොළඹ 1.

10–326—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : විඅ/4/78.

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

**1970-71 එක්සත් රාජධානි පොදුරාජ්‍ය මණ්ඩලීය ගුරු පුහුණු ආධාර ශිෂ්‍යත්ව**

අංක 14,872 හා 1969. 9. 19 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ 1969. 9. 11 දින දරණ නිවේදනයෙහි 3 (vi) (ආ) ඡේදය හා (ඊ) ඡේදය පහත සඳහන් අයුරු මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) ඉල්ලුම් කරන්නේ කාර්මික ගුරු පුහුණු පාඨමාලා සඳහා නම්—ඉහත 3 වැනි ඡේදයේ (i) සිට (v) දක්වා සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු අතර, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ ඇති කිසියම් කාර්මික ආයතනයක යටත් පිරිසෙයින් තුන් අවුරුදු සේවයක් 1969. 10. 4 දිනට සම්පූර්ණ කර ඇති එම ආයතනයක ආචාර්ය මණ්ඩලයේ නියුක්ත වුවකු විය යුතුයි."

(ඊ) ඉල්ලුම් කරන්නේ අ. පො. ස. උසස් පෙළ පන්තිවල විද්‍යාව හා ගණිතය ඉගැන්වීමේ පාඨමාලාව සඳහා නම්—ඉහත 3 වැනි ඡේදයේ (i) සිට (v) දක්වා සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු අතර, 1969. 10. 4 වැනි දිනට අ. පො. ස. උසස් පෙළ පන්තිවල විද්‍යාව හෝ ගණිතය ඉගැන්වීම පිළිබඳ යටත් පිරිසෙයින් තුන් අවුරුද්දක පළ පුරුද්දක් සහිත පුහුණු විද්‍යා උපාධිධාරීන් විය යුතුය."

2. මෙම සංශෝධනය හේතුවෙන් අයදුම් කිරීමට සුදුසු කම් ලබන අපේක්ෂකයින් සම්බන්ධයෙන් පමණක් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 1969. 10. 16 දින දක්වා දීර්ඝ කෙරේ.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය,
මැලේ වීදිය,
කොළඹ 2,
1969 ඔක්තෝබර් මස 1 දින.

10–448—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 500, කොළඹ 1), කාකි ඩ්‍රිල් සැපයීම සඳහා 1969 දෙසැම්බර් 9 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුවේ අධිකාරී තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 දෙසැම්බර් මස 7 වැනි ඉරිදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දීය.

10–309—69.00.9 දින අංක 14,875 රන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 1), මෙරට සෑදූ වීදුරු තබලේරු සැපයීම සඳහා 1969 නොවැම්බර් 4 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝර්ම් කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1969 නොවැම්බර් 3 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී.

1969 ඔක්තෝබර් මස 9 වැනි දින,
කොළඹ දීය.

10–310—69.10.9 වැනි දින අංක 14,875 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කවුඩුල්ල ව්‍යාපාරයේ 1 වෙනි පියවරේ 6—8 යායේ ගොඩනැගිලි ආදිය තැනීම

ඉහත සඳහන් ව්‍යාපාරයේ පහත දැක්වෙන පොදු ගොඩනැගිලි ආදිය තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969.10.30 දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | |
|---|---|
| 1. ජනපද නිවාස | 57 |
| 2. වැසිකිළි | 51 |
| 3. ඕවර්සියර් නිවාස | 1 |
| 4. උප තැපැල් කාර්යාලය | 1 |

2. 1969.10.28 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහාලූ ලියුම්කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "කවුඩුල්ල ව්‍යාපාරයේ 1 වෙනි පියවරේ පොදු ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම් පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාරදීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට තුන් මසක් ඇතුළත වැඩය නිම කළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ, දැන්වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.10.30 දින පෙරවරු 11.00 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ රු. 50,000 සට වැඩියෙන් රෙජිස්ටර්වූවන් විය යුතු අතර ටෙන්ඩර්පත් ලබාගැනීමේදී එම රෙජිස්ටර්වීම ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා විධායක ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1969,26.

10–315—69.10.9 වැනි දින අංක 14,875 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කවුඩුල්ල ව්‍යාපාරයේ කෙරවල වාඩියේ පොදු ගොඩනැගිලි තැනීම

ඉහත සඳහන් කෙරවල වාඩියේ පහත දැක්වෙන පොදු ගොඩනැගිලි තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969.10.30 වැනි දින පෙවරු 11 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

| | |
|---|---|
| 1. සිසුන් 800 කගේ පාසැල් ගොඩනැගිල්ල | |
| 2. ගුරු නිවාස | 3 |
| 3. අවිවාහක ගුරු නිවාස | 1 |
| 4. විද්‍යාලයාධිපති තැනගේ නිවාස | 1 |

2. 1969.10.28 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහා ලූ ලියුම් කවරයේ වම්පස කෙළවරේ "කෙරවල වාඩියේ පොදු ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොට කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරී තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට නව මසක් තුළදී වැඩය නිම කළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ, දැන්වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන්

කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.10.30 දින පෙරවරු 11.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ රු. 50,000 කට වැඩියෙන් රෙජිස්ටර්වූවන් විය යුතු අතර ටෙන්ඩර්පත් ලබාගැනීමේදී එම රෙජිස්ටර්වීම් ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා විධායක ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1969.9.26.

10–316—69.10.9 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

**පොළොන්නරුව දිස්ත්‍රික්කයේ කවුඩුල්ල ව්‍යාපාරයේ 1 වෙනි පියවරේ අංක 5 යායේ (වරක්) ජනපදික නිවාස හා වැසිකිළි තැනීම**

ඉහත සඳහන් ව්‍යාපාරයේ පහත දැක්වෙන ජනපදික නිවාස ආදිය තැනීම සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1969.10.30 දින පෙවරු 11 වන තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | ජනපදික නිවාස | 55 |
| 2. | වැසිකිළි | 225 |

2. 1969.10.28 වෙනි දින දවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතක් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂතැනගේ අංක 1 දරණ ගිණුමට හෝ බැහැර කච්චේරියක රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. රිසිට් පත් තැන්පත් මුදල ආපසු ඉල්ලන විට ඉදිරිපත් කළ යුතුයි. ඒවා ටෙන්ඩරයට ඇමිණිය යුතු නොවේ.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළ හොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් බහා ලූ ලියුම් කවරයේ වම්පස කෙළවරේ "කවුඩුල්ල 1වෙනි පියවරේ ජනපදික නිවාස ආදිය තැනීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ යන ලිපිනයට එවිය යුතුයි. ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය ලියුම් කවරයේ වම්පස පහළ කෙළවරේ සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් ප්‍රධාන ගණකාධිකාරි තැන වෙත භාර දීම හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි.

6. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේය. ඒවා සලකා බැලීමට ඇති හෙයින් ටෙන්ඩර් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගත නොහැක්කේය.

7. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරය පිළිගත් දින සිට හය මසක් තුළදී වැඩය නිම කළ යුතුය.

8. සාර්ථකවූ ටෙන්ඩර්කරු වැඩය පටන් ගැනීමට හෝ ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ, දැන්වූ කල්හි, පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ අසමත් වුවහොත් තැන්පත් මුදල රාජසන්තක වෙනවා පමණක් නොව, ටෙන්ඩර්කරුගේ නමද රජයේ කොන්දේසි කඩකල කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නේ ය.

9. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1969.10.30 දින පෙරවරු 11.15 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

10. ටෙන්ඩර්කරුවන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ රු. 50,000 කට වැඩියෙන් රෙජිස්ටර්වූවන් විය යුතු අතර ටෙන්ඩර්පත් ලබාගැනීමේදී එම රෙජිස්ටර්වීම් ඔප්පු කළ යුතුය.

11. මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතුය. ඒ කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ සිටින අය අතුරිනි.

12. ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය හා ටෙන්ඩරයේ යම් කොටසක් පමණක් භාර ගැනීමේ බලය රජය සතුවේ.

13. වැඩි විස්තර සඳහා විධායක ඉංජිනේරු තැනගෙන් විමසන්න.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1969.9.26.

10–317—69.10.9 දින අංක 14,950 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතර උප කොට්ඨාශය

1969-70 මුදල් වර්ෂය සඳහා මාතර, උප කොටසට බඩු ආදිය ප්‍රවාහනය කිරීම පිණිස දකුණු කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969. 10. 22 වැනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර් භාරගෙන එවලේම විවෘත කරනු ලැබේ.

2. මෙම ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක්කේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණි.

3. මෙම ටෙන්ඩර් පෝර්ම මාතර, ගාල්ල, හම්බන්තොට, හා තිස්සමහාරාමය, වාරිමාර්ග කාර්යාලයන්ගෙන් රාජකාරි වේලාවන්හිදී 1969. 10. 20 වෙනි දින දවල් 12 වන තෙක් ලබාගත හැක. ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට ඉදිරිපත් වන අයදුම්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත ඉදිරිපත් කළ යුතු අතර, එදින වන විට දෙපාර්තමේන්තුවේ භාරගෙන තිබෙන වැඩවල වටිනාකම ගැන විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක්කේ රු. 25 ක මුදලක් තැන්පත් කර රිසිට් පතක් මෙම කාර්යාලයෙන් හෝ කච්චේරියකින් ලබාගෙන එය ඉදිරිපත් කිරීමෙනි.

4. ටෙන්ඩර් පෝර්ම නිකුත් කරණු ලබන්නේ මෙවැනි වැඩ සඳහා අවශ්‍ය වාහන සහ කම්කරුවන් යෙදවිය හැකි බව ඔප්පු කිරීමට හැකියාවක් ඇති අයට පමණි.

5. මෙයට අදාල අනිකුත් විස්තර ආදිය මාතර, වාරිමාර්ග කාර්යාලයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් කාර්යාලීය වේලාවන්හිදී දැන ගත හැකිය.

එච්. ඩී. සී. ගුණවර්ධන,
වාරිමාර්ග ඉංජිනේරු,
මාතර, උප කොට්ඨාශය.

1969, සැප්තැම්බර් මස 26 වෙනි දින,
මාතර වාරිමාර්ග කාර්යාලයේ දිය.

10–373—69.9.10 දින අංක 14,875 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පොල්ගහවෙල කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානය හා පශු වෛද්‍ය කාර්යාලය සෑදීම

ඉහත සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1969. 11. 6 දින පස්වරු 2.30 වන තුරු ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. කොළඹ 5, නාරාහේන්පිට, අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේ පලතුරු කම්හල් පාරේ, පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි ෆෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කල යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 70,000 කට නොඅඩු ගොඩනැගිලි කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ රජයේ දෙපාර්තමේන්තුවක හෝ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කලවිට 1969. 10. 23 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියා පදිංචි කිරීමේ ලියවිල්ලක්,
(ආ) රුපියල් 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1969. 9. 29 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
පලතුරු කම්හල පාර,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
නාරාහේන්පිට,
කොළඹ 5.

6–392—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1969 ඔක්තෝබර් මස 22 වෙනි බදාදා පූ. භා. 10 වන තෙක් භාර ගනු ලැබේ.

1. මාහෝ—යෝජිත ඩිපෝවේ ගොඩනැගිලි පාරවල් සහ අංගන ඉදිකිරීම.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතකින යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකි අතර, අදාල සැලසුම් පත් යනාදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 2,50,000ක් හෝ එයට අධික වැය වන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. එවැනි කොන්ත්‍රාත්කරුවන්ගේ සහතිකපත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන අනුමත කල හොත් පමණක් ඉහත සඳහන් කර්මාන්තය සඳහා රු. 500ක ටෙන්ඩර් ඇප මුදල සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් රු. 25ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරී තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ විට 1969.10.17 වෙනි සිකුරාදා මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. මෙම කර්මාන්තය සඳහා ටෙන්ඩර් කිරීමට ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අතිරේකව රු. 5,00,000 වැය වන සිවිල් ඉංජිනේරු කර්මාන්තයන් අවුරුද්දක් ඇතුලත සතුටුදායක අන්දමින් නිම කර භාරදීමට හැකියාවක් හා තත්ත්වයක් ඇති බැව් ඔප්පු කිරීමට අවශ්‍ය සාධකයන් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට.

4–430—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය

### ජිප්සම් ටොන් 15,000ක් සැපයීම සඳහා මිළ ගණන් කැඳවීම

කන්කසන්තුරේ සහ ගාල්ලේ පිහිටි සිමෙන්ති කම්හල්වලට ජිප්සම් ටොන් 15,000ක් සැපයීම සඳහා 1969 ඔක්තෝබර් මස 28 දින සවස 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

සියලුම විස්තර සහ ටෙන්ඩර් පත්‍ර ෆෝර්මයන් පහත දැක්වෙන ලිපිනයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට රු. 100ක තැන්පත් මුදලක් පහත සඳහන් කාර්යාලයට ගෙවිය යුතුය.

ටෙන්ඩර් පත්‍ර 1969 ඔක්තෝබර් 27 දින දහවල් 12.30 වන තුරු නිකුත් කරනු ලැබේ.

ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය.

සැපයීම් අංශය,
තැ. පෙ. 1382,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

6–434—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ත්‍රිකුණාමලය උප කොටස

ත්‍රිකුණාමල උප කොට්ඨාශය යටතේ කච්චිකිඩංගු කුලම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් පත් ත්‍රිකුණාමලයේ ඔර්සිල් කන්දෙහි ත්‍රිකුණාමල කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1969 ඔක්තෝබර් මස 27 දින සඳුදා පෙරවරු 10 දක්වා භාර ගනු ලැබේ.

2. ඒ ඒ වැඩය සඳහා දී ඇති මිළ ගණන් වූ 40,000 හෝ ඊට වැඩි මුදල්වලට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, ග්‍රාම සංවර්ධන සමිතිවලට හා මුපකාර සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය.

3. 1969 ඔක්තෝබර් මස 23 දින දක්වා කාර්යාල වේලාවන්හිදී ත්‍රිකුණාමලය අල්ලේ හා කන්තලේ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැකිය. ආකෘති පත්‍රවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ආකෘතිපත් සඳහා ඉල්ලුම් කරන විට ටෙන්ඩර්කරුවන් විසින් තමාගේ ලියාපදිංචි පොත දැනට වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ කරන වැඩ හා ඒවායේ වටිනාකම ද දක්වෙන ප්‍රකාශනයක් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතු ද නැද්ද යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත් ලබා ගැනීමට ඒ ඒ වැඩය සඳහා දී ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් වන රු. 50ක වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කර ඒ වෙනුවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ පිළිබඳ වැඩි විස්තර ත්‍රිකුණාමලයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

පී. බී. පෝල්,
වාරිමාර්ග ඉංජිනේරු,
ත්‍රිකුණාමලය උප කොටස.

69. 9. 29,
ඇතුජ වරාය පාර,
ත්‍රිකුණාමලය.

10-409

## ධීවර දෙපාර්තමේන්තුව

### පුහුණු මාරු 1 නැමැති පුහුණුකරවීමේ බෝට්ටුව විකිණීම

"පුහුණු මාරු 1" නමැති බෝට්ටුව විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර කොළඹ 3, ගාළුමුවදොර ධීවර දෙපාර්තමේන්තුවේ ධීවර අධ්‍යක්ෂ විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි හා වැඩිවිස්තර 69.10.22 වැනි දින දහවල් 12 වන තෙක් පහත අත්සන් කර ඇති අයගෙන් ලබාගත හැකිය.

ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 69.10.26 වැනි දින පෙ. ව. 10.30 ට අවසන් කරනු ලැබේ.

ටෙන්ඩර් තැන්පත් මුදල රු. 200 කි.

අයි. ඔ. ක්. ජ්. ප්‍රනාන්දු,
ධීවර අධ්‍යක්ෂ.

ධීවර දෙපාර්තමේන්තුව,
කොළඹ 3,
1969 සැප්තැම්බර් මස 24 වැනිදා.

4–296—69.6.20.දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## මැතිවරණ දෙපාර්තමේන්තුව

### ඉවත ලනු ලබන කඩදාසි මිලයට ගැනීම

මෙයට අමුනා ඇති උපලේඛනයේ නිශ්චිත ලෙස සඳහන් කර ඇති මැතිවරණ කාර්යාල 25 ඉවත ලනු ලබන කඩදාසි මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1969.10.29 වැනි දින පෙරවරු 10 දක්වා කොළඹ, මැතිවරණ දෙපාර්තමේන්තුවේ මැතිවරණ කොමසාරිස් තුමා විසින් භාර ගනු ලැබේ.

2. අමුනා ඇති ආදර්ශ ආකෘතින් මගින් ටෙන්ඩර් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වේ. විශේෂ ආකෘතින් නිකුත් කරනු නොලැබේ.

3. සියලුම ටෙන්ඩර් පත්, අනුපිටපත් සහිතව මුද්‍රා තබා වම් අත පස උඩ කෙළවරේ ''ඉවත ලන කඩදාසි මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් ඉල්ලීම'' යනුවෙන් සඳහන් කරන ලද කවරයක බහා එම කවරය ටෙන්ඩර් පත්‍රය බව හඳුනා ගැනීමට නොහැකි වන තවත් ලොකු කවරයක බහා එවිය යුතුය.

4. ටෙන්ඩර්පත් ලියාපදිංචි කරන ලද තැපෑලෙන් ද එවිය හැක. ප්‍රාදේශීය ඉල්ලුම් කරුවෙකු, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය මේ අන්දමින් එවීමට අදහස් නොකරන්නේ නම්, ඔහුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පුද්ගලිකව පැමිණ මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රය භාරගෙන එය භාර ගත් බවට සහතිකයක් දීමට බලය දී ඇති මැතිවරණ දෙපාර්තමේන්තුවේ කාර්ය ල සභකාර තැනට එය භාර දිය හැක.

5. අපේක්ෂිත ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට සියලුම කාර්යාලවලින් හෝ එක්තරා නියමිත කාර්යාලයකින් හෝ කාර්යාල කීපයකින් හෝ කඩදාසි ගෙන යාම සඳහා ඉල්ලුම් කළ හැක.

6. එක් එක් ටෙන්ඩර් පත්‍රය සමඟ මැතිවරණ කොමසාරිස් නමින් වූ රුපියල් 25 ක මුදල් ඇනවුම් පතක් එවිය යුතුවේ. ටෙන්ඩර් ලාභියා විසින් ගිසුවිම් පත්‍රය අත්සන් කළ පසු ඔහුගේ සහ අනික් සියලුම ටෙන්ඩර් ඉල්ලුම් කරුවන්ගේ ඇප මුදල් ආපසු ගෙවනු ලැබේ.

7. ඉහත සඳහන් නියමයන්ට අනුකූල නොවූ ටෙන්ඩර් පත් ප්‍රතික්ෂෙප කරනු ඇත.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්.

1969 සැප්තැම්බර් 27 දින,
කොළඹ 7, මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ දීය.

### උපලේඛණය

මෙහි පහත සඳහන් මැතිවරණ කාර්යාල 25හේ විකිණීම සඳහා ඇති ඉවත ලන කඩදාසි ආදිය 1970.9.30 වැනි දින තෙක් මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රය.

ටෙන්ඩර් ඉල්ලුම් කරු විසින් මිල ගනන් ඉලක්කමෙන් සහ අකුරෙන් සඳහන් කළ යුතුය.

ලාංකික නොවන පුද්ගලයන්, ලාංකික නොවන කොම්පැනි සහ සමාගම් විසින් එවනු ලබන ටැන්ඩර් භාර ගනු නොලැබේ.

කුණු කුඩවල ඇති කඩදාසි කැබලි, පරණ ආකෘති, පාවිච්චි කරන ලද නාමලේඛන ආදියෙන් යුක්තවූ මිශ්‍ර ඉවත ලන කඩදාසි මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි. ඒවා විකිණීම සඳහා පහත සඳහන් කාර්යාලවල තබා ඇත.—

ඉලක්කම්වලින් (අකුරින්)
රු. ශ.

1. මැතිවරණ කොමසාරිස් කාර්යාලය, කොළඹ.
2. මැතිවරණ කාර්යාලය, කොළඹ කච්චේරිය
3. මැතිවරණ කාර්යාලය, රජින මාවත, කොළඹ 3.
4. මැතිවරණ කාර්යාලය, සාගර පාර, කොළඹ 4.
5. මැතිවරණ කාර්යාලය, අම්පාර
6. මැතිවරණ කාර්යාලය, අනුරාධපුරය
7. මැතිවරණ කාර්යාලය, බදුල්ල
8. මැතිවරණ කාර්යාලය, මඩකලපුව
9. මැතිවරණ කාර්ය ලය, ගාල්ල
10. මැතිවරණ කාර්ය ලය, හම්බන්තොට
11. මැතිවරණ කාර්යාල , යාපනය
12. මැතිවරණ කාර්යාලය, කළුතර
13. මැතිවරණ කාර්යාලය, මහනුවර
14. මැතිවරණ කාර්යාලය, කෑගල්ල
15. මැතිවරණ කාර්ය ලය, කුරුණෑගල
16. මැතිවරණ කාර්යාලය, මන්නාරම
17. මැතිවරණ කාර්යාලය, මාතලේ
18. මැතිවරණ කාර්යාලය, මාතර
29. මැතිවරණ කාර්යාලය, මොනරාගල
20. මැතිවරණ කාර්යාලය, නුවරඑළිය
21. මැතිවරණ කාර්ය ලය, පුත්තලම
22. මැතිවරණ කාර්යාලය, පොලොන්නරුව
23. මැතිවරණ කාර්යාලය, රත්නපුරය
24. මැතිවරණ කාර්යාලය, ත්‍රිකුණාමලය
25. මැතිවරණ කාර්යාලය, වවුනියාව

### විකිණීමේ කොන්දේසි

1. ටෙන්ඩර් ලාභියා තම කොන්ත්‍රාත්තුව විධිමත් ලෙස සහ අවංක ලෙසත්, ඉටු කරන බවට ඇපයක් වශයෙන් මැතිවරණ කොමසාරිස් වෙති රු. 500 ක ඇප මුදලක් තැන්පත් කළ යුතු අතර, ඔහු සමඟ කොන්ත්‍රාත්තුවකට ඇතුලු විය යුතුය.

2. කොන්ත්‍රාත්කරු විසින් තම ගේ වියදමින් සෑම මැතිවරණ කාර්යාලයකින්ම එක්කාසුවී තිබෙන ඉවත ලන මිශ්‍ර කඩදාසි එක්කාසු කිරීමට ද කිරුම් බර ගැනීමට ද මාස්පතා ඒවා ගෙනයාම සඳහා ද නිසි කටයුතු සලස්වා ගත යුතුය.

3. ඉවත ලනු ලබන කඩදාසිවල මුළු වටිනාකම ටෙන්ඩර් ලාභියා ඒවා ගෙන යන අවස්ථාවේ දී මැතිවරණ නිලධාරියාට ගෙවිය යුතුය.

4. ඉවත ලන කඩදාසිවල තත්ත්වය සම්බන්ධව කිසිම වගකීමක් නැති වාක් හැර කොන්ත්‍රාත්කරුට කඩදාසි තෝරා ගැනීමට ද නොහැක. මැතිවරණ කාර්යාලවලින් පිරිනමන අන්දමට බාර ගත යුතුය.

.................................... පදිංචි ....................................
................................................................ වන මම/අපි
ඉවත ලන කඩදාසි මිලයට ගැනීම පිළිබඳව ................................වෙනි දිනැති ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම අනුව, ඉහත සඳහන් වූ එක් එක් ද්‍රව්‍ය අංක යටතේ සලකුනු කර ඇති මිල ගණන් වලට සහ මෙය අමුනා ඇති ටෙන්ඩර් කොන්දේසි වලට, යටත්ව ඉවත ලන කඩදාසි මිලයට ගැනීමට මම/අපි ඉදිරිපත් වෙමි/වෙමු.

මෙම ටෙන්ඩරය පිලිගන්නේ නම් ටෙන්ඩරය සඳහන්ව ඇති සියලුම කොන්දේසි වලට යටත්ව සැපයීම් නොපිරිහෙලා ඉටු කිරීමට ලංකා රජය සමඟ ස්ථිරවම එකඟ වන බවට මම/අපි ප්‍රතිඥවක් දෙන්නෙමි/දෙන්නෙමු.

............................................
ටෙන්ඩර්කරුගේ අත්සන.

දිනය.—..............................

6–276—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

## සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව

**සේවක ආපන ශාලාව—කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපල කටුනායක**

කටුනායක, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපලේ සේවක ආපන ශාලාවක් පවත්වා ගෙන යෑම සඳහා 1969.10.26 වැනි දින පෙ. ව. 10 තෙක්, කොළඹ 1, තැ. පෙ. 535 යන ලිපිනයේ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ විසින් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ආහාරපානාදිය සැපයීමේ කොන්ත්‍රාත්තුව, ආපන ශාලාව පටන් ගන්නා දින සිට එක් වර්ෂයක කාල පරිච්ඡේදයකට පමණක් සීමා වේ.

3. ටෙන්ඩර්කරුවන් ආහාරපානාදිය සැපයීමේ කටයුත්තේ යෙදී යටත් පිරිසෙයින් පස් වර්ෂයකවත් පළපුරුද්දක් ලබා සිටිය යුතුවාත් හැර, තමන් සතු සම්පත් හා හැකියාව ගැන සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැන සෑහීමට පත් කළ හැකි තත්ත්වයක සිටිය යුතුය.

4. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයෙන් හෝ කොළඹින් බැහැර ඕනෑම දිසාපති කාර්යාලයක හෝ රු. 25 ක මුදලක් තැන්පත් කොට, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන්, 1969.10.24 වැනි දින දහවල් 12 තෙක් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල දෙපිට පතකින් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

ඩබ්ලිව්. ඇල්. පී. ද මැල්,
සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ.

තැ. පෙ. 535,
ලෝටස් පාර,
කොළඹ 1.
එෆ්. 29. 69.9.29.

...

6–305—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

වලවේ යෝජනා ක්‍රමයෙහි ජනපද නිවාස 2,000 ක් පමණ සෑදීම සඳහා, 1969 ඔක්තෝබර් මස 27 වැනි දින මධ්‍යහ්න 12.00 දක්වා කොළඹ බෞද්ධාලෝක මාවතේ අංක 415, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ, මධ්‍ය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් කිරීමට හිමිකම් ඇත්තේ කිසියම් මණ්ඩලයක, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක රු. 2,00,000 ක හෝ ඊට වැඩි මුදලක් සඳහා ලියා පදිංචි කොන්ත්‍රාත්කරුවන්ට පමණි.

ටෙන්ඩරයකට රු. 250 ක තැන්පත් මුදලක් ගෙවීමෙන්, කොළඹ, මණ්ඩලයීය ප්‍රධාන කාර්යාලයෙන් 1969, ඔක්තෝබර් 26 දින දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක.

වෙනත් විස්තර පහත අත්සන් කළ අයගෙන් ලබා ගත හැක.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධනමණ්ඩලය.

1969. 9. 28 දින,
කොළඹ.

66–404—69.6.20 දින අංක 14,850 දරන ගැසට පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**බදුල්ල සහ මොණරාගල දිස්ත්‍රික්කවල පිහිටි පාසැල් වලට "ඇදිහැස" කිරි විස්කෝතු ප්‍රවාහන කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි—1969/70**

වර්ෂ 1969 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ පහත දැක්වෙන කාර්යයන් සඳහා සීල් තබන ලද පිටපත් 2 කින් යුත් ටෙන්ඩර් පත්‍ර 1969 ඔක්තෝබර් මස 24 වැනි දින පෙරවරු 10.30 දක්වා, බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

සැපයීමේ මධ්‍යස්ථාන වලින් ඇදිහැස කිරි විස්කෝතු පාසැල් වලට ප්‍රවාහනය කිරීම.

(i) පහත දැක්වෙන අයුරු විස්කෝතු අසුරා ඇත. 19" × 11" × 9" ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටිවල රු. 20 බැගින් අසුරා ඇත. (ආසන්න වශයෙන්)

පහත සඳහන් සේවාවන් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

**බදුල්ල සැපයීමේ මධ්‍යස්ථානයේ සිට :—**

(1) බදුල්ල, මහියංගනය, සොරණාතොට, පස්සර, මීගහකිවුල, බිබිල සහ මොණරාගල මණ්ඩලය.

**හපුතලේ සැපයීම් මධ්‍යස්ථානයේ සිට :—**

(2) හපුතලේ සහ වැල්ලවාය මණ්ඩලය.

2. බණ්ඩාරවෙල ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගෙන් ලබා ගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ඉල්ලුම් කළ යුතුයි. බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ බදුල්ල කච්චේරියේ හෝ රු. 100 ක් තැන්පත් කර ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන්, 1969 ඔක්තෝබර් 23 වනදා දහවල් 12 දක්වා, ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගත හැක. අනුමත කරණ ලද සමිති විසින් ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම අනවශ්‍යයි.

3. ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් 1969 ඔක්තෝබර් මස 24 වැනි දින පෙරවරු 10.30 ට බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ තැනගේ කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර, ටෙන්ඩර් භාරදීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000 කට නොඅඩු වටිනාකම් ඇති නිශ්චල දේපොල ඇති බවට, තම ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරී තුමාගෙන් මෑතකදී ලබාගත් සහතිකයක් ද ඉල්ලුම්කරු නමින් ලියා පදිංචි කරන ලද, මේ වර්ෂයට වලංගු බලපත්‍ර ඇති ලොරි යක්, 2 ක් වත් ඇති බවට සෑහෙන සාක්ෂිද, බණ්ඩාරවෙල, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

5. අනුමත කරණ ලද සමූපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමූපකාර සමිති විසින් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පෙර. එකී සමිතියට මෙම සේවාව ඉටු කිරීමට හැකියාවක් ඇති ලොරි සේවයක් ඇති බවට, සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් කම්කරු කොමසාරිස් ගෙන් හෝ ලබාගත් සහතිකයක්, බණ්ඩාරවෙල, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩරයක් සම්පූර්ණයෙන් භාර නොගැනීම හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමට බලය, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතුවේ. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට, සති 6 ක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුය.

7. අමතර විස්තර සඳහා බණ්ඩාරවෙල අධ්‍යාපන අධ්‍යක්ෂ ගෙන් ඉල්ලුම් කරන්න.

පී. ඊ. ජී. මෙන්ඩිස්,
බණ්ඩාරවෙල, ප්‍රා. අධ්‍යාපන අධ්‍යක්ෂ.

1969 ඔක්තෝබර් මස වැනි දින,
බණ්ඩාරවෙල, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදිය.

6–403—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙන යාම

**ටෙන්ඩර ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1969 ඔක්තෝබර් 1 වෙනිදා සිට 1970 සැප්තැම්බර් මස 30 වැනිදා දක්වා (දෙදිනම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, පිටි කිරි දුම්රිය ස්ථානවල (සෞඛ්‍ය කාර්යාල වල) සීනි, සමූපකාර තොග ගබඩාවල සිට සෞඛ්‍ය කාර්යාල වලට ද සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට ද ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර මාතලේ සෞඛ්‍ය අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රුපියල් 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියේ තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, බදුල්ල, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර නුවර, කුරුණෑගල, මාතර, කෑගල්ල, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොකරන අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූවිට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු පිටිකිරි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උප ලේඛනයෙහි 3 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරී, මාතලේ'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ද පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායඹාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමා ම මගේ කායඹාලයේ ප්‍රාදේශීය ලේකම් මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරන ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන ඡෙදයේ සඳහන් දිනයන්හි, පෙවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙල කර ගැනීමට හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉක්මවන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු නියමිත ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවෙකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේ ය.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දැන ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් මගින් මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරීගෙන් විමසන්න.

ඒ, උඩවත්ත,

69.9.29 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කායඹාලයේ දීය.

## උප ලේඛනය

| සේවය | ප්‍රදේශය | දෙමසකට වරක් ගෙනයන ප්‍රමාණය්ය පිටිකිරි හො. | සීනි හො. | විවෘත කරන දිනය හා වේලාව |
|---|---|---|---|---|
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරිද, මාතලේ සමුපකාර බඩු ගබඩාවේ සිට සීනි ද, මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායඹාලයට සහ මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායඹාලයේ සිට මාතලේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... ... ... ... | මාතලේ ... | 21– ... | 8½ | 69.10.29 පූ.භා. 10 ට |
| කදුරුවෙල දුම්රිය ස්ථානයේ සිට පිටි කිරිද, තමන්කඩුව සමුපකාර සංගමයේ සිට සීනි ද, හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තැනගේ කායඹාලයට සහ හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී තැනගේ :ායඹාලයේ සිට හිඟුරක්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ද ... ... ... | හිඟුරක්ගොඩ | 13½ ... | 6– | |
| කැකිරාවේ දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි ද, දඹුල්ල සමුපකාර සංගමයේ සිට සීනි ද, දඹුල්ලේ සෞඛ්‍ය කායඹාලයට සහ දඹුල්ලේ සෞඛ්‍ය කායඹාලයේ සිට දඹුල්ලේ සෞඛ්‍ය කායඹාලය භාර නිළධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | දඹුල්ල ... | 22½ ... | 8½ | |
| මාතලේ දුම්රිය ස්ථානයේ සිට පිටි කිරි ද, මාතලේ සමුපකාර සංගමයේ සිට සීනි ද, රත්තොට සෞඛ්‍ය කායඹාලයට සහ රත්තොට සෞඛ්‍ය කායඹාලයේ සිට රත්තොට සෞඛ්‍ය කායයාලය භාර නිලධාරී තැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථාන වලට ... | රත්තොට ... | 30 ... | 11½ | |

10–370/1—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් සහ සේවා.**—1969 ඔක්තෝබර් 1 වනදා සිට 1970 සැප්තැම්බර් 30 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උප ලේඛනයේ 2 වන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘතිපත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වක්කමේ විස්කර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර්පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (2) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි වෙතට" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවර යෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලා ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීයමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන්න ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි

1969.9.29 දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දීය.

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | සේවකයන්ට | | | | නොගෙවන රෝගීන්ට | | | |
| | රු. | රු. | | මාළු | මස් | කරවල | එළවළු | මාළු | මස් | කරවල | එළව |
| 1. නාලන්ද පර්යන්ත ඒකකය ... | 100 ... | 800 ... | 69.10.29 දින පෙ.ව. 10ට | 250... | 250... | 250... | 250... | 1,000... | 1,050... | 1,000... | 5,000 |

10–370/2—69.6.20 දින අංක 14,850 දරන ග සට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1970 ජනවාරි 1 වන ද සිට 1970 දෙසැම්බර් 31 වන ද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් ගෙන් හෝ ලාංකික සමාගම් වලින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර මාතලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්ය ලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (1) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—එම උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමූපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(2) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්ය ලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල. කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය අධිකාරිවරුන්ගේ කාර්යල වලින් හෝ ලබාගත හැක නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි ආකෘතිපත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් ආකෘතිපත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘතිපත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (II) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී වෙතට'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරීලේකම්තැනට හෝ භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි තීරණය.**—ටෙන්ඩර්පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ආකෘති පත්‍රයේ ''බී'' උපලෙඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම්වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ආකෘති පත්‍රයෙහි ''සී'' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකුවීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරුට රෝගීන් සහ සේවකයන් විසින් භාරදී ඇති කූපන් වෙනුවෙන් සහන මිළ යටතේ හෝ නොමිළයේ හෝ 1966.12.19 දින සිට පවතින ක්‍රමයට අවශ්‍ය සහල් ආහාර දෙපාර්තමේන්තුවෙන් ලබා ගැනීමට ආයතන භාර ප්‍රධානියා විසින් බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

ඒ. උඩවත්ත,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1969 සැප්තැම්බර් මස 29 වැනි දින,
මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේ දී ය.

උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට: මස් | සේවකයන්ට: මාළු | සේවකයන්ට: කරවල | සේවකයන්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: මස් | නොගෙවන රෝගීන්ට: මාළු | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| පල්ලේගම ගෘහ රෝහල | ... 100... | 800 | — 69.10.29 — වැනි දින — පෙරවරු 10ට — | — ... | 500... | 1,000... | 2,000... | — ... | 1,500... | 3,000... | 5,500 |

10–370/4—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434යේ සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ, සභාපති තැන විසින් වැලිමඩ රජයේ රෝහලේ ජල සම්පාදන ක්‍රමය සඳහා විදුලි බලයෙන් ක්‍රියා කරන පොම්ප සැපයීම සහ සවිකිරීම නොවැම්බර් මස 14 වෙනි අඟහරුවාදා පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ.

2. කොළඹ 7 හි පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම්වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන විසින් 1969 ඔක්තෝබර් මස 24 වන සිකුරාදා පස්වරු 4 වනතෙක් නිකුත් කරනු ලබන්නේ ජල සම්පාදන ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැනගේ නමට අය වන ලෙස කොළඹ ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් 50 ක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු ය.

3. ටෙන්ඩර් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කොට ඇති සමුපකාර සමිති.

## රත්නපුර කච්චේරිය

### ජෝශප් හෝක් පුණ්‍ය අරමුදලින් ගංවතුරෙන් අනාථ වන අය සඳහා ගෙවල් පහක් සෑදීම

ගංවතුරෙන් අනාථ වන අයවළුන් සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ ගලතුර වසමේ රජයට අත්පත් කර ගන්නා ලද බෝතලයාය හේන නම් ඉඩමේ ගෙවල් පහක් සෑදීම සඳහා 1969 නොවැම්බර් මස 10 වැනි සඳුදා පස්වරු 2 වනතෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් ටැන්ඩර් පත් භාරගනු ලැබේ.

2. රජයේ දෙපාර්තමේන්තුවල රුපියල් 30,000 ක් හෝ ඊට වැඩි මුදලක් සඳහා කොන්ත්‍රාත් කරුවන් වශයෙන් ලියා පදිංචි වී සිටින අයට හෝ ග්‍රාම සංවර්ධන සමිති, විවිධ සේවා සමුපකාර සමිති හෝ වඩු කර්මාන්ත සමිති වලට 1969 නොවැම්බර් මස 5 වැනි බදාදා උදේ 10 වනතෙක් රත්නපුර දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම අපේක්ෂකයින් විසින් දිසාපති කාර්යාලයේ දී මේ වැඩ වෙනුවෙන් රුපියල් 100 ක මුදලක් තැන්පත් කර ලබා ගත් කුවිතාන්සියක් දිසාපති කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් පසු ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. යථෝක්ත සමිති විසින් මෙම මුදල තැන්පත් කිරීම අනවශ්‍යය. චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නො ලැබේ.

4. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කොට අනු පිටපතක්ද සමඟ ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩරය බහා එවන කවරයේ උඩ වම් කෙළවරේ ටෙන්ඩර්කරුගේ නමද, ලිපිනයද, වැඩෙහි නමද ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර තැපෑලෙන් නොඑවන්නේ නම් රත්නපුර දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක.

5. 1969 නොවැම්බර් මස 10 වෙනි සඳුදා පස්වරු 2 ට මෙම දිසාපති කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිත වරුන්ට හෝ පැමිණ සිටිය හැක.

6. ටෙන්ඩර් කරුවන් මෙම කොන්ත්‍රාත්තුව යටතේ වැඩ කරවා ගැනීමට ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට එකඟ විය යුතුයි.

7. වැඩි විස්තර දිසාපති කාර්යාලයේ සමාජසේවා අංශයෙන් ලබා ගත හැක.

වී. ඊ. කුලසිංහ,
රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1969 සැප්තැම්බර් මස 29 වන දින,
රත්නපුර දිසාපති කාර්යාලයේ දී.

0–324–69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව—බස්නාහිර දිසාව

#### දැව වෙන්දේසිය

තොග 9කින් යුත් කදන් ඝන අඩි 1,113.4ක්, තොග 1කින් යුත් ඉරූ ලී ඝන අඩි 125.0ක් තොග 3කින් යුත් පිටපලු 700ක් සහ තොග 1කින් යුත් සිල්පර 1ක්, රත්නපුර බස්නාහිර දිසා වන නිලධාරී විසින් 1969.10.17 දින පෙරවරු 10ට අගලවත්ත අඩවි වන නිලධාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දැව ගලඕපිටිය, කිතියාවල, කොඩිකන්ද, කලුගල යන මාර්ගාසන්න දැව ගබඩාවලද, වන අපරාධ අංක 55/69ට අයත් සහ අගලවත්ත වන වගා ප්‍රදේශයේ ඇත.

වෙන්දේසියේ ඉල්ලීමට බලාපොරොත්තුවන භවතුන් වෙන්දේසියට ප්‍රථම එම දැව බලා සෑහීමකට පත්වන ලෙස ඉල්ලා සිටිනු ලැබේ. මෙය පිළිබඳ වැඩි විස්තර රත්නපුර බස්නාහිර දිසා වන නිලධාරීන් ගෙන් හෝ අගලවත්ත අඩවි වන නිලධාරිගෙන් හෝ ලබාගත හැක.

එස්. එන්. ප්‍රනාන්දු,
බස්නාහිර දිසා වන නිලධාරී.

දි. ව. නි. කාර්යාලය,
රත්නපුර, 69. 9. 15.

6–442—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ ඊ 2 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 ඔක්තෝබර් මස 21 වෙනි දින පෙ. ව. 10ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 ඔක්තෝබර් මස 19 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ඈස්. ඒ. සන්සෝනි,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඕ/විකිණීම්/13.
1969 ඔක්තෝබර් මස 1 වෙනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. මිටි සහිත පොරවා 11 යි
2. කෑම මේසයට ගන්නා හැඳි, ගෑරුප්පු, පිහි යනාදී කාටුන් 4 යි
3. පුයර කුඩු ගෝනි 729 යි
4. කඩදාසි රෝල් 69 යි
5. මිටි නොමැති පොරවා පෙට්ටි 4 යි
6. රසායන ද්‍රව්‍ය ඩ්‍රැම් 9 යි
7. ටින්වල අසුරන පුයර ටින් කාටුන් 21 යි
8. කොයිල් 15 යි
9. යකඩ කෑලි ගෝනි 10 යි
10. ඇණ පෙට්ටි 10 යි
11. කුපන් රෙදි බේල් 28 යි
12. නූල් රෝද පෙට්ටි 3 යි
13. ටයර් 120 යි
14. ටයර් 49 යි
15. බෙහෙත් ද්‍රව්‍ය කාටුන් 11 යි
16. විසිත්ත කාමර ආසන කාටුන් 1 යි
17. ප්ලාස්‍ටික මාලු ටින් කාටුන් 26 යි
18. දිග වතුර පයිප්ප (කැන්වස් රෙදි) බේල් 2 යි
19. ඉටි රෙදි රෝල් පෙට්ටි 3 යි
20. යන්ත්‍රෝපකරණ පෙට්ටි 17 යි
21. පොත් හා සඟරා පෙට්ටි 2 යි
22. වානේ කැබිනට්ටු (ලේඛන සඳහා) කාටුන්ස් 6 යි
23. යන්ත්‍රෝපකරණ කාටුන් 3 යි
24. කොඩ්ලිවර් ඔයිල් කාටුන් 5 යි
25. රසායන ද්‍රව්‍ය ඩ්‍රැම් 5 යි
26. රසායන ගඩොල් ගල් පෙට්ටි 8 යි
27. පිඟියා පෙට්ටි 7 යි
28. හිස් හම් බෑග් 4 යි
29. ටයර් 10 යි
30. රථ වාහන දුනු කොළ මිටි 10 යි
31. බෙහෙත් ද්‍රව්‍ය කාටුන් 1 යි
32. ටින් තහඩු පෙට්ටි 2 යි
33 ග්ලෝරි මේස ලාම්පු පෙට්ටි 1 යි
34. හම් රෝල් කාටුන් 1 යි
35. වීදුරු චිමිනි කාටුන් 1 යි
36. රැවුල් කපන රේසර් පෙට්ටි 3 යි

10–444—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

## රේගු දෙපාර්තමේන්තුව

**වෙන්දේසියේ විකිණීම**

කොළඹ, රේගුවේ ට්‍ර්. 3 විකිණීම් ගුදමේ තැන්පත් පහත සඳහන් බඩු 1969 නොවැම්බර් මස 4 වැනි දින පෙ. ව. 10ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1969 නොවැම්බර් මස 2 වැනි දින පෙ. ව. 10 සිට පෙ. ව. 11.30 දක්වා එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතක් ඇතුළත ගෙන නොගිය හොත් එම බඩු නැවත විකුණනු බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුයි.

සී. එස්. මෙන්ඩිස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඩීව්/69/32.
1969 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

| | | |
|---|---|---|
| 1. වේප් පටි (ටයිප් රයිටර්) | තොග | 1 යි. |
| 2. පිත්තලවලින් සාදන ලද රත් කාසි සහ වෝලා කිරණ උපකරණ | තොග | 1 යි. |
| 3. බර කිරීමට ගන්නා පඩි | තොග | 1 යි. |
| 4. ප්ලාස්ටික්වලින් සාදා ඇති විදුලි පහන් දම් සහිත යතුරු කවර | පෙට්ටි | 1 යි. |
| 5. පිස්තෝල රුවැති විදුලිපන්දම් සෙල්ලම් බඩු | කාටුන | 2 යි. |
| 6. ඔරියන්ටල් වර්ගයේ විදුලි මේස ලාම්පු | පෙට්ටි | 1 යි. |
| 7. කන්නාඩි සහිත සාක්කු විදුලිපන්දම් | පෙට්ටි | 1 යි. |
| 8. සිල්ව මිස්ට් | පෙට්ටි | 2 යි. |
| 9. රබර් බොලොක්ක සහිත බයිසිකල් පැඩල් | පෙට්ටි | 1 යි. |
| 10. ආයුර්වේද බෙහෙත් ද්‍රව්‍ය (මීමල්) | මළු | 2 යි. |
| 11. විදුලි බලයෙන් ක්‍රියාකරවන ආහාර කරකරන උපකරණයක් සහ ආහාර මිශ්‍රකිරීමේ උපකරණයක් (යුෂ ඇඳගැනීමේ උපකරණ) | | |
| 12. රෙදි විවීමට ගන්නා ලෝහමය නූල් | පෙට්ටි | 1 යි. |
| 13. වානේ කම්බි බුරුසු | පෙට්ටි | 7 යි. |
| 14. කරකැවිය හැකි දඬු අඩුව සහිත කිණිසිරි | පෙට්ටි | 10 යි. |
| 15. පින්ස් තුනකින් යුත් සොකට්ස් සහ ප්ලග් ටොප්ස් බැටන් හෝල්ඩර් | ඇහුරුම් | 26 යි. |

10–441—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වෙන්දේසි කිරීම්

වවුනියා අඩවියේ වවුනියා දුව ගබඩාව, පොම්පමඩු හන්දිය සහ වේලන්කුලම් යන ස්ථානවල ඇති ඝන අඩි 28.0 යුක්තවූ 1 වැනි පංතියේ ඉරූ දුව කෑලි 48 සහ ඝන අඩි 1030.9 යුක්තවූ 1 වැනි පංතියේ කඳන් 127, 1969.10.16 දින පෙ. ව. 10ට වවුනියා දිසා වන නිලධාරී විසින් වවුනියා අඩවි වන කාර්යාලයේදී වෙන්දේසි කරනු ලැබේ.

මෙම දුව වෙන්දේසි කිරීමට ප්‍රථම පරීක්‍ෂා කර බලන ලෙස වෙන්දේසියෙන් දුව ගැනීමට අපේක්‍ෂා කරන සියලු දෙනාගෙන්ම කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි විස්තර මෙහි පහත අත්සන් කර ඇති අයගෙන් හෝ වවුනියා අඩවි වන නිලධාරීගෙන් හෝ ලබා ගත හැකිය.

ඈම්. රත්වත්ත,
දිසා වන නිලධාරී—වවුනියාව.

දිසා වන කාර්යාලය,
වවුනියාව.
1969.9.17.

10–295—69.6.20 දන අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තු දැව වෙන්දේසිය

මුල්ලියාවලි අඩවියේ ඇති බුරුත, හල්මිල්ල, වැවරණ, පලු, සහ මිල්ල යන වර්ගයන්ට අයත් ඝන අඩි 395.5 යුත් කඳන් 49 සහ 1 වැනි පංතියේ කනු 12, 2 වැනි පංතියේ කනු 20 සහ 3 වැනි පංතියේ සාමාන්‍ය කනු 6 වවුනියා දිසා වන නිලධාරී විසින් 1969.10.20 දින පෙ. ව. 10 ට මුල්ලියාවලි අඩවි වන කාර්යාලයේදී වෙන්දේසි කරනු ලැබේ.

මෙම දැව වෙන්දේසි කිරීමට ප්‍රථම පරීක්ෂාකර බලන ලෙස වෙන්දේසියෙන් දැව ගැනීමට අපේක්ෂා කරන සියලු දෙනාගෙන්ම කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. මෙම වෙන්දේසිය සම්බන්ධයෙන් වැඩි විස්තර මෙහි පහත අත්සන්කර ඇති අයගෙන් හෝ මුල්ලියාවලි අඩවි වන නිලධාරිගෙන් ලබා ගත හැකිය.

ඈම්. රත්වත්ත,
දිසා වන නිලධාරි, වවුනියාව.

දිසා වන කාර්යාලය,
වවුනියාව,
1969.9.19

10–274—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා නාවික හමුදුව

**සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

1969 ඔක්තෝබර් මස 21 වෙනි අඟහරුවාදා දින පෙරවරු 10 ට කොළඹ, කොච්චිකඩේ රාජකීය ලංකා නාවික හමුදුවේ රා. ව. ලං. "රංගල" ආයතනයේ දී පහත දැක්වෙන සේවයට අයෝග්‍ය බඩු බාහිරාදිය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. විකුණනු ලබන විෂයයන් 1969 ඔක්තෝබර් මස 21 වැනි දින පෙරවරු 8 සිට 10 දක්වා වේලාව තුල දී පරීක්ෂා කළ හැකිය.

වෙන්දේසිය අවසානයේදී සම්පූර්ණ මුදල ගෙවීම අවශ්‍ය වේ. මිළ දී ගත් විෂයයන් එදින පස්වරු 4 ට පෙර ඉවත්කර ගත යුතුයි.

රා. කදිරගාමර්,
නාවික හමුදපති.

1969 සැප්තැම්බර් මස 21 වෙනි දින,
කොළඹ, රාජකීය ලංකා නාවික හමුදු මූලස්ථානයේදිය.

පැට්‍රල් ලාම්පු, ලන්තෑරුම්, රථවාහන අමතර කොටස්, භූමිතෙල් උදුන්, හාල් කල්දේරම්, ඇනමල් බේසම්, ඇනමල් ජෝගු, පිඟිය, ඇනමල් පිඟන්, නැවියන්ගේ ජර්සි, පුල් ඕවර්, කැන්වස් සපත්තු, බැටරි 12 සහ 6 වෝල්ට්ස්, මලකඩ කැඩීමට අඳින කණ්නාඩි, පිත්තල ඉබි යතුරු, කාර්පට්ස්, මොණරු පාපැදි, ඉලෙක්ට්‍රොලක්ස් ශීත කරනය—මොඩලය—"එල්" 20, විදුලි පන්දම් කෑලි තුනෝ, සිංහල යතුරු ලියනයක්, පයිප්ප පුවු, ස්පේයර්—නැප්සැක්, ඇම්පිලිපයර්—60 ඩබ්. 230 වොට්ස්, කැරම් බෝඩ්, යකඩ ඇඳන් වෝනො යනාදිය.

10–294—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් අත් ඔර්ලෝසු. ට්‍රාන්සිස්ටර් රේඩියෝ, ටේප් රෑකෝඩර්, කැමරා, විදුලි රැවුල බාන සහ සිනිමා ප්‍රක්ෂේපකයන් (සිනේ ප්‍රොජැක්ටර යක්) කොළඹ, රජයේ රේගුවේ මගින් පර්යන්ත වේදිකාවේ දී මෙම දැන්වීමේ දැක්වෙන ලැයිස්තුව අනුව 1969 ඔක්තෝබර් මස 17 සහ 18 යන දිනයන්හි පෙ. ව. 9.00 ට විකිණීම අරඹා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණුනු ලැබේ. 1969 ඔක්තෝබර් මස 17 සහ 18 යන දිනයන්හි විකුණනු ලබන භාණ්ඩයන් 1969 ඔක්තෝබර් මස 16 වැනි දින කොළඹ, රජයේ රේගුවේ ගමන් බඩු කායසීාලයේ දී ප්‍රදර්ශණය කෙරෙනු ඇත.

විස්තර ඇතුලත් ලැයිස්තු රේගුවේ ප්‍රධාන නිවාරණ නිළධාරී, ප්‍රධාන ගාස්තු නිළධාරී, සහ රේගුවේ දිගු කාමරයේ විමසීම් කවුන්ටරයෙන් ලබාගත හැක.

මෙම අත් ඔර්ලෝසු, ට්‍රාන්සිස්ටර් රේඩියෝ, ටේප් රෑකෝඩර්, කැමරා, විදුලි රැවුල බාන සහ සිනිමා ප්‍රක්ෂේපකය භාරදෙන අවස්ථාවේ දී අයකැමි වෙත ආකෘති පත්‍රයක දෙනු ලබන වගකීම් කරයක් අනුව මෙම භාණ්ඩ යලි නොවිකිණීම හා වෙනත් අයුරකින් අන් සතු නොකිරීම හා යන නියමා එකඟත්වයට යටත්ව මේ භාණ්ඩ විකුණනු ඇත. ගැනුම් කරුවෙත නිකුත් කරන කුවිතාන්සියේ ''නැවත විකිණීම් හෝ අයිතිය පැවරීම හෝ සඳහා වලංගු නොවේ'' යයි සඳහන් කර ඇත.

පුද්ගලයන් සඳහා පමණක් ලන්සු භාරගන්නා අතර, එක් අයෙකුට එක භාණ්ඩයක් පමණක් ලබාගැනීමට හිමිකම් ඇත. සාප්පු හෝ සමාගම් වෙනුවෙන් ඉදිරිපත් කරන ලන්සු භාර නොගැනෙයි. වෙන්දේසියට නොපැමිණියෙකු වෙනුවෙන් ද ලන්සු භාරගනු නොවනු ඇත. අවසාන ලන්සුව අනුව අලෙවි මිළ ප්‍රමාණවත් වන්නේ යයි අයකැමි එත්තු ගත්තේ නම් එක් එක් විකිණීම අවසානයේ දී සම්පූර්ණ මුදල ගෙවීමෙන් බඩු ඉවත් කර ගත හැක.

### බඩු වල විස්තර

| විකුණනු ලබන දිනය | අත් ඔර්ලෝසු | | |
|---|---|---|---|
| 1969 ඔක්තෝබර් 17 ... | බෙස්කෝ | ... | 2 |
| | බයිපෝරා | ... | 1 |
| | කැස්ටල් | ... | 13 |
| | වැවලේ | ... | 1 |
| | කොස්ටල් | ... | 1 |
| | ඩිමැක්ස් | ... | 2 |
| | ඩෝරාල් | ... | 1 |
| | ඊස්ටෝ | ... | 5 |
| | හිකොක් | ... | 25 |
| | ඉන්වික්ටා | ... | 4 |
| | ජොරින් | ... | 2 |
| | නෙල්සන් | ... | 34 |
| | සොරානා | ... | 30 |
| | | | 120 |

ට්‍රාන්සිස්ටර් රේඩියෝ

| | | |
|---|---|---|
| ස්ටැන්ඩර්ඩ්—වීආර්. 8 විකාශන 2, බැන්ඩ් 3, ඇස්ආර්—එච් 506 | ... | 1 |
| කොමොඩොර්–වීආර් 6 මොඩල් 205 සාක්කුවේ පාවිච්චි කරණ | ... | |
| ආයිබා ''ඕල් ට්‍රාන්සිස්ටර්'' බැන්ඩ් 4, මොඩල් ජීආර් 101 | ... | 1 |
| ''සන්යෝ'' බැන්ඩ් 3, වීආර් 8 මොඩල් 8 යූ. පී 35 | ... | 2 |
| ''ස්ටැන්ඩර්ඩ්'' බැන්ඩ් 3, වීආර් 8, හයිපයි ... | ... | 1 |

### බඩුවල විස්තරය

| විකුණන දිනය | අත් ඔර්ලෝසු | | |
|---|---|---|---|
| 1969 ඔක්තෝබර් මස 18 | බියුලර් | ... | 8 |
| | වැවලේ | ... | 1 |
| | කොඩෝසා | ... | 2 |
| | ඩොනඩා | ... | 1 |
| | ඩිමැක්ස් | ... | 1 |
| | ඩූටා | ... | 1 |
| | ඉලැක්ස් | ... | 8 |
| | ඉලක්සෝරා | ... | 1 |
| | ඊටන් | ... | 3 |
| | පරිනියා | ... | 1 |
| | ප්‍රිබැන් | ... | 1 |
| | ගෝල්ඩ් බෙල් | ... | 1 |
| | හිකොක් | ... | 30 |
| | ජොරින් | ... | 1 |
| | කාන්ස් | ... | 2 |

| විකුණන දිනය | අත් ඔර්ලෝසු | | |
|---|---|---|---|
| | කින්ස් | ... | 1 |
| | ලැන්කෝ | ... | 2 |
| | ලැටෝර් | ... | 1 |
| | ලිලි | ... | 1 |
| | ලීඩියා | ... | 1 |
| | ලීඩියා | ... | 1 |
| | ලේඩි | ... | 1 |
| | මැඩානා | ... | 1 |
| | මැටිනාමැටික් | ... | 1 |
| | මිකි | ... | 2 |
| | මිනිමැක්ස් | ... | 1 |
| | නෙල්කෝ | ... | 1 |
| | නොර්ජ් | ... | 1 |
| | නොරෙක්ස් | ... | 2 |
| | නිවාඩා | ... | 8 |
| | ඔර්නිවල් | ... | 1 |
| | ඔල්මා | ... | 2 |
| | ඕර්නිමා | ... | 2 |
| | රැන්ඩල් | ... | 4 |
| | රොඩෙනියා | ... | 1 |
| | සාසන් | ... | 17 |
| | සැන්ක්ටස් | ... | 5 |
| | ඩොර්නා | ... | 27 |
| | සෙවාන්සී | ... | 2 |
| | සෙනාජෙම් | ... | 4 |
| | සැස්ඩෝස් | ... | 3 |
| | ටියුනිස් | ... | 2 |
| | අඥත | ... | 1 |
| | රොයිස් | ... | 1 |
| | රෝසරි | ... | 1 |
| | | | 159 |

ට්‍රාන්සිස්ටර් රේඩියෝ

| | | | | |
|---|---|---|---|---|
| ''ස්ටැන්ඩර්ඩ්'' බැන්ඩ් 3, වීආර් 8 මොඩල් ඇස්ආර්—එච් 506 | | | ... | 13 |
| ''පිලිප්ස්'' ට්‍රාන්සිස්ටර් රේඩියෝ බැන්ඩ් 3 | | ... | ... | 1 |
| ''මැක්ට්'' පෙනොග්‍රාප් මොඩල් ආර්පී 800 | | ... | ... | 1 |
| ''ටැලිපන්කන්'' විලුක්ස් ට්‍රාන්සිස්ටර් (කාර් බැන්ඩ් 4 මොඩල් 205 ... | ... | ... | ... | 1 |
| ''ටොෂබා'' සොල්ඩ් පෙට්ටි රේඩියෝ පොනෝග්‍රාප් මොඩල් පීපී 17 ... | ... | ... | ... | 1 |
| ''පායි'' කොන්ටිනැන්ටල් ට්‍රාන්සිස්ටර් රේඩියෝ ටැලිපෝන් මොඩල් ටී 801 | ... | ... | ... | 1 |
| ''වොක්සෝල්'' කාර් රේඩියෝ මොඩල් පීඑච්බී 2 | | | ... | 2 |
| ''හයිසෝනික්'' ට්‍රාන්සිස්ටර් රේඩියෝ සාක්කු—වීආර් 6 ඇ–ප් ආර් 619 ... | ... | ... | ... | 6 |
| ''සන්යෝ'' ට්‍රාන්සිස්ටර් රේඩියෝ ඒසී/ඩීසී/බැන්ඩ් 3 වීආර් 8 මොඩල් වී යූ 604 එන් | ... | ... | ... | 2 |
| ''නැෂනල්'' පැනසෝනික් ට්‍රාන්සිස්ටර් රේඩියෝ මොඩල් ආර් 225 ... | ... | ... | ... | 2 |
| ''නැෂනල්'' ටේප් රෑකෝඩර් | | ... | ... | 1 |
| කාර් රේඩියෝ | ... | ... | ... | 1 |

කැමරා සහ විදුලි රැවුල

| | | | | |
|---|---|---|---|---|
| ''ඔලිම්පස්'' පන් කැමරා | ... | ... | ... | 1 |
| විදුලි රැවුල බාන | ... | ... | ... | 2 |

සිනිමා ප්‍රක් ෂේපක (සිනේ ප්‍රොජෙක්ටර්)

| | | | |
|---|---|---|---|
| සිනිමා ප්‍රක්ෂේපකය (සිනේ ප්‍රොජැක්ටර්) | ... | ... | 1 |

(''බෙල් සහ හොවල්'' කථා විකාශන සහ උපාංග යහිතවේ)

අත්සන්කලේ/ වී. පී. සිල්වා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. පීඕ/විකිණීම්/6/69.
නිවාරණ කායසීාලය, රජයේ රේගුව,
කොළඹ, 1969 සැප්තැම්බර් මස 29 ද.

10–311—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය

## ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

පහත දක්වෙන ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ, 1969 ඔක්තෝබර් 20 දින පෙරවරු 11.30ට කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 54 දරණ තැන පිහිටි ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ ගබඩා කාමරයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මිලයට ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවිය යුතු වන අතර එම භාණ්ඩ එදිනම සවස 4.30ට පෙර ඉවත් කර ගත යුතුද වේ.

| | | | |
|---|---|---|---|
| (අල්මාරි) කබර්ඩ් | | ... | 1 |
| ලිපිගොනු කැබිනෙට්ටු (ලී) | ... | ... | 3 |
| ඇඳි පුටු | ... | ... | 6 |
| බයිසිකල (ලගේජය සහිත) | ... | ... | 2 |
| පිල්ටර (බර්ත් පිල්ඩ්) | ... | ... | 1 |
| වැලි කබා | ... | ... | 1 |
| සාමාන්‍ය මේස (ලොකු) | ... | ... | 2 |
| සාමාන්‍ය මේස (කුඩා) | ... | ... | 2 |
| ටයිප් කරුවන්ගේ මේස | ... | ... | 2 |
| (ඉංග්‍රීසි) ටයිප් යන්ත්‍ර | ... | ... | 2 |
| කැරම් ලෑලි | ... | ... | 1 |
| භූමිතෙල් උඳුන් | ... | ... | 1 |
| ටයිප් කරුවන්ගේ පුටු | ... | ... | 2 |

ආනයන හා අපනයන පාලක.

1969 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ කොටුවේ චැතැම් වීදියේ,
අංක 54 දරණ තැනදීය.

6–416—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පබය

---

# විවිධ දැන්වීම්

## සුරාබදු දෙපාර්තමේන්තුව

### බිඳුණු බෝතල් කැලි

කළුතර, මහනුවර සහ මඩකලපුවේ සුරාබදු ගුදම්වල බිඳුණු අරක්කු බෝතල් කැලි විශාල තොග එකතුවී ඇත. ඒවා අවශ්‍ය අයෙකුට නොමිලයේ ඉවත් කර ගැනීමට ඉඩ දිය හැක.

කොළඹ 7 හි සුරාබදු කොමසාරිස්ගෙන් විමසන්න.

මූ. බ. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1969.9.29.

10–440—69.6.20 දින අංක 14,850 දරන ගැසට් පත්‍රය